
කාලයාත්‍රිකයා සම්පූර්ණ කතාව




- ***කාලයාත්‍රිකයා:part 01***

***කාලය හරිම පුදුමාකාරයි කිව්වොත් ඔබ එකගද?***

***ඔබට එකග වෙන්නම වෙනවා.මොකද
එක වෙලාවකට කාලය ඉක්මනින් ගෙවෙනව නම් හිතිල ඇති.ඒ වගේම තව වෙලාවක
කාලය මෙච්චර ඉක්මනට ගෙව්ච්ච එක ගැන
කනගාටු වෙනවා ඇති.කවද හරි කව්රුත් කියලා තියෙනවද මට කාලය හරහා ගමන්
කරන්න පුලුවන් කියලා......?***

***මම සහන් අබේසිංහ.මගේ වයස  අවු:16 යි.මම  ජීවත් වෙන්නෙ නුගේගොඩ***

*අවට ප්‍රදේශයක.මගේ අම්මා මගේ ලග නෑ .
එයා නැතිවෙලා තියෙන්නෙ මට අවු: 04 විතර
වෙනකොට.මගේ තාත්තා විද්‍යාඥයෙක්. එයා වැඩ කරන්නෙ විවිධ නව නිර්මාණ කරන
ආයතනයක. ඒක පෞද්ගලික ආයතනයක්.
රටේ ලොකු දේශපාලනඥයෙක් තමයි.ඒ ආයතනය ආරම්භ කරල තියෙන්නෙ.දැන්නම්
එයා දේශපාලන කරන්නෙ නෑ. ඒ ආයතනයේ ප්‍රදන පරීක්ෂකවරයා තමයි මගේ තාත්තා.
එයා හරිම කලාතුරකින් තමයි ගෙදර එන්නෙ .ඒ තරමට වැඩ.ඒත් මම කවදාවත්
තාත්තගෙ lab එකට ගිහින් නෑ.
මොකද එතනට යන්න දෙන්නෙ සේවකයින්ට
විතරයි.එතන සේවකයො 100 විතර ඉන්නවා.
හා තව දෙයක් මගේ අම්මත් වැඩ කරල තියෙන්නෙ මෙතන.එයා ගැන මම වැඩි විස්තර
දන්නෙ නෑ මොකද තාත්තා මට වැඩි විස්තර කියලා නෑ අම්ම ගැන.*

*මේ කතාව පටන් ගන්නෙ මට වෙච්ච අත් වැරදිමකින් එද සදුද දවසක් (සතියේ
දවස් වලින් මට එපාම කරපු දවස). මම බොහොම අමාරුවෙන් රෑ එළි වෙනකම් (එළි
වෙනකම් කිව්වට රෑ 01:30 විතර වෙනකන්) හදපු project එකත් තාත්තගෙ lab එකේ බෑග්
එකකට දල (වෙන බෑග් එකක් හොයන්න කම්මැලිකමට)පොඩි නින්දක් දන්න ඇදට ගියා
phone එක අරගෙන එලාම් එක 5:30ට දල නිදු ගත්තා(නිදු ගත්ත කිව්වට ඇස්
පියවෙනකොටම එලාම් එක වැදුනා ) .මම නැගිට්ටා මොකද තාත්තා උදේම වැඩට යනව
මම හදපු project එක දැම්මෙ තාත්තගෙ lab එකේ බෑග් එකකට නිසා.එතකොට තමයි
මම වෙලාව දැක්කෙ වෙලාව 06:30යි. කොහොමද එහෙම උනේ මම phone එක අතට
අරගෙන බැලුවා මම වැරදිමකින් එලාම් දල තියෙන්නෙ 6:30ට .මම පරක්කුයි තාත්තා
ගිහින්.අද තමයි Project එකේ අන්තිම දවස අද project එක ගෙනිච්චෙ නැති උනොත් සර්
අනිවාර්යයෙන්ම තාත්තට කියනවා(සර් කාරයා තාත්තගෙ යාලුවෙක්) ඊට පස්සෙ ඉතින්
..........
මම තාත්තට call එකක් ගත්තා phone එක off. ඒක නිසා මම තාත්තගෙ lab එකට ගියා.
ගෙදර ඉදල lab එකට වැඩි දුරක් නෑ. ඒක නිසා ඉක්මනට ගිහින් අරන් එන්න හිතාගෙන
තමයි ගියේ .*

*මම lab එකට ගියා.පුදුමයි අද ආරක්ෂකයො කවුරුත් නෑ .වෙනදට ඉස්සරහ ඉන්න
කට්ටිය කවුරුත් නෑ .එතනට යනකොට වෙලාව 06 :50 විතර ඇති. කවදාවත් මම මෙච්චර
වේලසනින් lab එකට ඇවිල්ලම නෑ .තාත්තා ආවට වැඩ කරන අනිත් අය එන්නෙ හත
හමාරට විතර වෙන්නැති කියලා හිතන ගමන් මම තාත්තගෙ lab එක යන්න හිතාගෙන lift
එකට නැග්ග, lift එකේ බොත්තම් මුකුත් නැ පොඩි සිදුරක් වගේ තියෙනව. මම ඒකට
ඇගිල්ල තිබ්බා උඩ තිබුණු තිරයක ඇගිලි සලකුණ වැටුන. ඊට පස්සෙ අම්මගෙ රූපෙ
වැටුනා.මම කල්පනා කරා තාත්තගෙ lab එක තිබුණු තැන අවු :05 කලින් වෙනස්
කරා.(ඉස්සෙල්ලා lab එකේ පිපිරීමක් උනා ) මගේ අම්ම නැතිවෙලා අවු:12 වෙනවා
කොහොමද මගේ අම්මගෙ ඇගිලි සලකුණ තවම පාවිච්චි කරන්නෙ කියල .ඒ වගේම මට
තව ප්‍රශ්නයක් තිබුනා මගේ අම්මගෙ ඇගිලි සලකුණට මගේ ඇගිලි සලකුණ ගැලපුනු
එක.lift එක තාත්තගෙ lab එක තියෙන හයවෙනි තට්ටුව පහු කරගෙන ගියා නැවතුනේ
නැ. හත් වෙනි තට්ටුවෙ තමයි නැවතුනේ.මට හිතුණා අම්මා වැඩ කරන්න ඇත්තෙ මෙතන
කියලා.මොකද lift එක හිතුවෙ අම්ම
තමයි ආවෙ කියලා.*

Charuka Deshan

*මම lift එකෙන් එලියට ආව එතන තිබුනෙ තනි කාමරයක්  එතන මේස 03 ක් විතරයි තිබුනෙ.වෙන කිසිම දෙයක් නෑ. කාමරය හරිම අදුරුයි .මේස 03 අතර සමාන දුරක් තමයි තිබුනෙ. මම පලවෙනි මේසෙ ලගට ගියා ඒ මේස උඩ තිබුනෙ පැන් රදවනයක් විතරයි ඒ පෑන් රදවනයේ එක කලුපාට තීන්ත පෑන්ක් තිබුනා ඒක මම අතට ගත්තා දෙවැනි මේසෙත් ඒ වගේමයි.ඒත් එකෙ පෑන්ක් තිබුනෙ නෑ පෑන් රදවනයක් විතරයි තිබුනෙ.තුන්වෙනි මේසෙත් පෑන් රදවනය විතරයි.ඒත් එතන තව රාමු කරපු photo එකක් තිබුනා .මම ඒක අතට ගත්තා ඒක මමයි අම්මයි ගත්ත එකම photo එක මට හිතුණා තාත්තා මේක ගේන්න ඇති කියලා. එක පාරටම අමුතු සද්දයක් ඇහුනා මට එක විස්තර කරන්න අමාරුයි මම කවදවත් ඒවගේ සද්දයක් ඇහිලා නෑ. මම ඉක්මනට lift එකට ගියා lift එකේ දෙර වැහෙන කොටම මම දැක්කා වයසක මනුස්සයෙක් එක පාරටම  දෙවැනි මේසෙ වාඩිවෙලා ඉන්නවා.කොහොමද එහෙම උනේ මේ කාමරයට එන්න පුලුවන් මේ lift එකෙන් විතරයි වටේම තිබුනෙ බිත්ති විතරයි . ඒ මනුස්සයා මාව දකින්න කලින් lift එකේ දෙර වැහුනා මම හිතන්නෙ. ඒතන තිබුණු පෑනත් අරගෙන තමයි කලබලේට මම ඇවිත් තියෙන්නෙ කමක් නෑ ඒක එච්චර වටින එකක් නෙමෙයි කියලා හිතලා මම මගේ සාක්කුවට ඒක දගත්තා...... ඒත් මම හිතුවෙ නෑ ඒ පෑන මගේ ජීවිතය වෙනස් කරයි කියලා.....*

*කාලයාත්‍රිකයා:part 02*

*ඉස්සෙල්ලා කොටසෙ මම කිව්වා මම තාත්තගෙ lab එකට ගියපු හැටි ඒ වගේම එහේදි සිදුවුණු සිදුවීමත් මම ඒ දැකපු දෙය නිසා මට තාත්තාව හම්බවෙන්න ආපු කාරනෙත් මට අමතකයි.මම lab එකෙන් එලියට එන්න හදනකොටම.*

*"පුතා......පුතා..... ඔයා මොකද මෙතන"*

*එතකොට තමයි මම පියව් සිහියට ආවෙ.මම එකපාරටම ඒ පැත්ත බැලුව.එතන හිටියෙ ආරක්ෂක නිලධාරියෙක් අයියෝ දෙවියනේ මම උඩ ඉදල එන එක එයා දැක්කද දන්නෙ නෑ.*

*"පුතා ඔයා කාව හොයාගෙනද ආවෙ"*

*ඊට පස්සෙ මම මගේ තාත්තගෙ නම කියලා එයාව හම්බවෙන්න ආව කියලා එයාට කිව්වා.ඊට පස්සෙ එයා මාවත් එක්කගෙන පඩිපෙළ දිගේ තාත්තගෙ lab එකට යන්න පටන් ගත්තා.තට්ටු 6 ක්නෙ යන්න ටික වෙලාවක් යනවානෙ.ඒ අතර මම එයාගෙන් ප්‍රශ්න අහන්න් පට ගත්තා.*

Charuka Deshan

"අන්කල් ඇයි lift එකේ යන්න බැරිද lift එක කැඩිලද"

එයා හරිම කාරුණිකව මගේ දිහා බලලා "නෑ පුතා ඒක පාවිච්චි කරන්න පුලුවන් සේවකයින්ට විතර  ආරක්ෂකයින්ට බෑ " මම ආපහු ඇහුවා ඒ මොකද කියලා.

"මෙහෙමයි lift එක හරහා කෙලින්ම ඕනම තට්ටුවකට යන්න පුලුවන්නෙ ඒක නිසා ආරක්ෂාවට තමයි"

"ඒත් අන්කල්  පඩිපෙලිනුත් ඕනම තට්ටුවකට යන්න පුලුවන්නෙ "

"පුලුවන් තමයි ඒත් මෙතන තියෙන හැම තට්ටුවකටම පඩිපෙලින් යන්න පුලුවනුත් සේවකයින්ට විතරයි. මොකද හැම තට්ටුවකටම ඇතුල් වෙන්න තියෙන දෙරවල් හැම එකකමත් ඇඟිලි සලකුණු තියෙන යන්ත්‍රයක් තියෙනව"

"ඒ වගේම සේවකයින්ටත් තමන් වැඩ කරන තට්ටුවල  විතරයි යන්න පුලුවන්"

ඒ කියන්නෙ අපේ තාත්තට යන්න පුලුවන් තාත්තා වැඩ කරන තට්ටුවට විතරයි.ඒක හරිම අමුතුයි. මම නම් හිතන්නෙ මෙතන වෙනවා ඇත්තෙ ගොඩක් රහසිගත පරීක්ෂණ වෙන්න ඇති. මම කවදවත් තාත්තගෙ රස්සාව ගැන හොයන්න ගියේ නැත්තෙ තාත්තා ඒ ගැන ගෙදරදි කතා කරන්නෙත් නෑ.ඒ වගේම මට කවදවත් තාත්තගෙ රස්සාව ගැන හොයන්න හිතුනෙත් නෑ.

මම තාත්තගෙන් project එකත් ඉල්ලගෙන ඉක්මනට ඉස්කොලේ යන්න පිටත් උනා දැනටමත් වෙලාව 07:30 මම ඉක්මනට ඉස්කොලෙට ගියා.මම යනකොට ඉස්කොලේ පටන් අරන්. දන්නවනෙ
ඉස්කොලේ ඉන්න securityලගෙ හැටි.වුන් හිතන් ඉන්නෙ  වු තමයි ඉස්කොලේ විදුහල්පති කියලා.ඉතින් මම ශේප් එකේ පිට්ටනිය පැත්තෙ තාප්පෙන්  පැනල ඉක්මනට පන්තියට ගියේ දැනටමත් සර් පන්තියට ඇවිල්ල ඇති කියලා හිතාගෙන.ඒත් අද සර් ඇවිල්ල නෑ.එවුනාට ඉතිහාසය paper එකක් දීලා තිබුනා.මම paper එක කරන්න කියලා හිතාගෙන පෑන්ක් හොයනකොට තමයි දැක්කෙ පෑන් ටික කලබලේට දල ඇවිල්ලා.මම යාලුවොන්ගෙන් අහල බැලුවා එකෙක් ලගවත් වැඩිපුර පෑන්ක් නෑ.

එතකොට තමයි මට යාලුවො කිව්වෙ අද ඉස්කොලේ ක්‍රීඩා තරග පටන් ගත්තා කියලා.ඒක කියලා තියෙන්නෙ
උදේ රැස්වීමෙදි.ඒ කියන්නෙ අද ඉදල පිට්ටනියේම තමයි.ඉතිහාසෙ සර් කියල තියෙන්නෙ මේ paper එක ගෙදරදි කරගෙන එන්න කියලා.ඉතින් මම paper එක
බෑග් එකට දල පිට්ටනියට ගියා.ඉතින් ඔහොම දවසම ගෙවිල ගියා.

මම ගෙදර ගියේ හරිම මහන්සියෙන්.ගෙදර ගියපු ගමන් කෑම කාල පොඩි නිදක් දන්න ඇදට ගියා .එතකොට තමයි මට මතක් උනේ උදේ තාත්තගෙ lab එකේ සිදුවීම.මම බෑග් එකට අත දල lab  එකෙන් ගත්ත පෑන හෙව්වා. එතකොට තමයි මට හම්බවුනේ ඉතිහාසෙ paper එක.මම paper එක මේසෙ උඩ තියලා තියලා

*පෑන හොයන්න ගත්තා. එතකොට තමයි මට මතක් උනේ පෑන තිබුනෙ ඉස්කොලේ කලිසමේ සාක්කුවේ කියල මතක් උනේ.මම  කලිසම අරගෙන සාක්කුවේ තිබ්බ.*
*පෑන අතට ගත්තා.මම දැන් තමයි පෑන හරියට බැලුවෙ.*
*පෑන සාමාන්‍යය පෑනකට වඩා බරින් වැඩියි.මට ඕන වුනා ඒ පෑනනෙන් ලියලා බලන්න.මම මුලින්ම මේසෙ උඩ තිබුන පත්තරක ලියලා බැලුවා ලියන්න හරිම ලේසියි.ඒ නිසාම මම ඉතිහාසෙ paper එක ලියන්න ගත්තා ඒ පෑනෙන්ම.*

*පලවෙනි ප්‍රශ්නය තමයි කාශ්‍යප රජු විසින් ඉදි කරන ලද විශිෂ්ට නිර්මාණය කුමක් ද?*

*මම ප්‍රශ්නයට උත්රේ ලියන්න ගත්තා.සීගිරිය කියලා උත්රේ ලියලා වැඩි හොදට මම වරහන් ඇතුලෙ සීගිරිය ඉදිකරපු කාලයත් ලිව්වා .(ප්‍රශ්නයේ අහල නැති වුනත් මට ලියන්න හිතුණා)එසැනින්ම මට අර උදේ ඇහුන සද්දේ ඒ විදියටම ඇහුනා.මට එක පාරටම මගේ ඇග පන නැති වේගෙන යනවා වගේ දැනුනා. ඊලඟට මට සිහිය එනකොට මම දැක්කෙ අමුතුම දෙයක්.මම හිටියෙ හරිම අමුතු තැනක එතන හරියට වෙලදපොලක් වගේ මම හිටියෙ අමුතු කාමරයක තුන් පැත්තකින් බිත්ති වලින් වට වෙලා එක පැත්තකින් වෙලදපොලක් පේනවා. මම*
*ඒ පැත්තට ගියා.මොකක්ද මට මේ උනේ මම කොහෙද ඉන්නෙ.(මම මටම කියා ගත්තා) ඒත් එක්කම එතන හිටපු එක මනුස්සයෙක්.*

*"ආයුබෝවන් කාලයාත්‍රිකයා ඔබ මෙහි පැමිනියේ කුමක් නිසාද"*

*මම හිතුවෙ එයා වෙන කාටහරි කතා කරනවා කියලා ඒත් එයා මට තමයි කතා කරලා තියෙන්නෙ.මම මුකුත් හිතාගන්න බැරුව එයාගෙ මූන දිහා බලාගෙන හිටියා.*
*ඒ මනුස්සයා හරිම අමුතු විදියට කතාකරේ ඒ වගේම එයාගෙ ඇදුමුත් හරිම අමුතුයි.එයා එකපාරටම මෙහෙම කිව්වා.*

*"හරි හරි මට වැටහෙනවා මොකක්ද උනේ කියලා ඔබට  පලමු වරට නේද ඔබ මේ ගමන ආවෙ"*

*ඔහු සිනහමුසු මුහුනෙන් " ඔබව පිලි ගන්නවා සීගිරියට"කියාලා කිව්වා.එතකොට තමයි මම දැක්කෙ ඒ දර්ශනය.*

*කාලයාත්‍රිකයා:03*

*මට විශ්වාස කරන්න බැරි උනා මම දැක්ක දේ.මම ඇත්තටම ඉන්නෙ සීගිරිය ලග එතන හරිම ලස්සනයි.ඒත් කොහොමද එහෙම උනේ මට අන්තිමට මතක මම paper එක ලියන්න ගත්තා කියලා විතරයි.ඊට පස්සේ මොකද උනේ මම කොහොමද මෙතන ආවෙ.ඒ වගේ ප්‍රශ්න ගොඩක් මගේ ඔලුව ආව.*

Charuka Deshan

"හොඳයි දැන් මාව ඔබට හඳුන්වා දෙන්නම් මම ඊට කලින් ඔබ පැමිනි වර්ෂය පිලිබඳ විස්තර මට අවශ්‍යයි.මට පේන විදියට නම් ඔබ ක්‍රිස්තු වර්ෂ විසි එක්වන සියවසේ වගේ."

මම එක පාරටම උත්තර දුන්නෙ නෑ.මොකද මට තාම කිසිම දෙයක් හිතාගන්න බෑ.

"සමාවෙන්න... සමාවෙන්න.. මම ආපහු වැරැද්දුවා ආදුනික කාලයාත්‍රිකයෙකුට කතා කරන්න ඕන මේ විදියට නෙවෙයි"

"කරුණාකරලා රජතුමාට පැමිණිලි කරන්න එපා එහෙම උනොත් මාව ඉවත් කරාවි."

"ඔබ මේ සිටින්නේ ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ අග භාගයේ.පලමු කාශ්‍යප රජ සමයේ"

මම ඔබව රජු ලගට එක්ක යන්නම්.කරුනාකරලා රජතුමාට පැමිණිලි කරන්න එපා"ඔහු බැගෑපත්ව ඉල්ලා සිටියා. ඒත් තාම මට කතා කර ගන්න බෑ. මම හිස සලා එයට එකග බව ඔහුට ඇගවූවා.

"බොහොම ස්තුතිය ඔබට. මා පසුපසින් එන්න...."

මම ඒ මිනිසාව අනුගමනය කරමින් ඔහු පසුපසින් ගමන් කරා.මට ඕන උනා හරියටම දැන ගන්න මොකක්ද මට උනේ කියලා.

"ඔයාගෙ නම මොකක්ද"

"මම පිලිගැනීමේ නිලධාරියා.මගේ නම ඔබට අවශ්‍ය නෑ. මගේ රාජකාරි තමයි කාලයාත්‍රිකයින් පිලිගැනීම හා ඔබ වැනි ආදුනික කාලයාත්‍රිකයින්ට සේවා සැපයීම"

"ඔයා කියන්නෙ මම කාලය හරහා ගමන් කරා කියලද ?"

"ඔවු ඔබ කාලය හරහා ගමන් කරා"

"ඒත් මම අහල තියෙන්නෙ කාලය හරහා ගමන් කරන්න කාල යන්ත්‍රයක් ඕන කියල.මම ඕන තරම් චිත්‍රපටි බලලා තියෙනවා ඒ ගැන"මම ඔහුට කිව්වා.

"ඔවු ඔබටත් තියෙනවා ඒවගේ යන්ත්‍රයක් ඔයාගෙ සාක්කුවේ බලන්න"

මම සාක්කුවට අත දල බැලුවා තාත්තගෙ lab එකෙන් ගත්ත පෑන මගේ සාක්කුවේ තිබුනා.

"හරි ඔබේ ඊලඟ ප්‍රශ්නය පිලිතුර තමයි කාලය හරහා ගමන් කරන්න ඔයා හිතන් හිටියා වගේ ලොකු යන්ත්‍රයක් ඕන නෑ."

එතැනින් ඒ කතාව අවසන් උනේ අපි සීගිරිය පාමුලට ආව නිසා එතන හරිම ලස්සන විදියට පඩිපෙළ නිර්මාණය කරලා තිබුනා.ඒ වගේම ලස්සනට දිය අගලක් නිර්මාණය කරලා තිබුනා. ඒ දිය හරිම ලස්සන මානෙල් මල් වලින් වැහිලා තිබුනෙ.එතකොට තමයි

මට මතක් උනේ ඉස්කොලෙන් ගියපු අධ්‍යාපන චාරිකවෙ photo වලත් මේ වගේ දිය අගල්ක් තිබුනා කියලා.මම කවදවත් සීගිරියට ගිහින් තිබුනෙ නෑ ගිය අවුරුද්දේ අධ්‍යාපන චාරිකාව යන්න බැරි උනේ මට උන හැදුණු නිසා.ඒ දිය අගල ලග
ගොඩක් තද ආරක්ෂාවක් තිබුනා.මම එක්ක හිටපු මනුස්සයා එතන හිටපු ආරක්ෂකයෙක් ලගට ගිහින් මොකක්ද කිව්වා.ඒ මනුස්සයා අපි ඇතුලු වෙන්න ඉඩ දුන්නා.එතන ඔසවන්න පුලුවන් දෙරක් තිබුනා.ඒ දෙරෙන් විතරයි දිය අගල හරහා යන්න පුලුවන්.මම කියවලා තියෙනවා ඒක ආරක්ෂක උපක්‍රමයක් කියලා.

"පිලිගන්නවා රාජකීය උද්‍යානයට"

මම දැක්කෙ ඉතාම ලස්සන උද්‍යනයක් හරිම ලස්සනයි.

"ඔබ ජීවත් වෙන කාලයේ මේවා විනාශ වෙලා ගිහින් අර වතුර මල් විතරයි ඉතිරි වෙලා ඇත්තෙ මම හිතන්නෙ."

"ඔවු ඔබ හරි වතුර මල් විතරයි තමයි මගේ කාලයේ තියෙන්නෙ  ඒත් ඒ තරම් හොදට වතුර ඉහළට එන්නෙ නෑ අපේ කාලෙනම්"

"ඒක හේතුව තමයි නිවැරදි නඩත්තු කටයුතු සිදු නොවීම"

අපි උද්‍යානය පසු කරගෙන පඩිපෙළ දිගේ ඉහළට ඇදුනා.මම අහල තිබුනු විදිහට සීගිරියෙ කැටපත් පවුර වගේම සීගිරි අප්සරාවන් හමු වෙනවා පඩිපෙලින් යනකොට ඒත් අපිට එහෙම හම්බවුනේ නෑ.මම ඒ ගැන
පිලිගැනීමේ නිලධාරියාගෙන් ඇහුවා.

කැටපත් පවුර නම් තාම නිර්මාණය කරලා නෑ.ඒක නිර්මාණය වෙන්න තව කල් තියෙනවා.ඒ වගේම සීගිරිය අප්සරාවන් නිර්මාණය කරලා තියෙන්නෙ කාමරයක ඒ කාමරයට යන්න.උඩට යන්න ඕන.

අපි ඉහළටම ගියා.එතන හරිම ලස්සනයි.එතනත් හරියට උද්‍යානක් වගේ.මම හිතාගෙන හිටියෙ රජ කාලෙ එච්චර දියුණු තාක්ෂණයක් තිබුනෙ නෑ කියලා.ඒත් එතන ලස්සන මගේ ඒ මතය බොරුවක් කලා කියලා කිව්වොත් හරි.මාව කෙලින්ම එක්කගෙන ගියේ රජතුමා ගාවට.

රජතුමා මම හිතාගෙන හිටියට වඩා ගොඩක් වෙනස්.රජ කෙනෙක් කිව්වාම හිතේ මැවෙන්නේ ටිකක් මහත් ශරීරයක් තියෙන දරුනු කෙනෙක්නෙ.ඒත් මේ රජතුමා හරිම ප්‍රිය මනාප සාමාන්‍ය ශරීර ප්‍රමාණයේ කෙනෙක්.

"බොහෝම සතුටුයි ඔබව හමු වෙන්න ලැබිච්චි එක ගැන.විසි එක්වන සියවසේ මොන වර්ෂයෙන්ද ඔබ පැමිණියේ?"

Charuka Deshan

මම ඉතින් "මම 2017 වර්ෂයෙන් රජතුමනී "කියලා කිව්වා.

"හොදයි ඔබ ජීවත් වෙන්නෙ ශ්‍රීලංකාවේ  අභාග්‍යමත්ම කාල වකවානුවේ"

"මේ සියවසේ තමයි ශ්‍රී ලංකාව පාලනයට සුදුසු නැති පුද්ගලයන් පාලනය කරලා රට විනාශ කරන්නෙ.බය වෙන්න එපා තව වසර කිහිපයකින් රට පාලනයට  බුද්ධිමතුන් මැදිහත් වෙනවා. රට යමතාක් දුරකට විනාශයෙන් බේර ගන්න ඔවුන්ට හැකි වෙනවා"

"හරි එහෙනම් ඔබ මේ නිලධාරියා සමග යන්න."

මම නිලධාරියාත් එක්ක රජ මැදුරෙන් පිට උනා.ඔහු මාව එක්කගෙන ගියේ හරිම අමුතු කාමරයට. ඒ කාමරය ඇතුලෙ තිබුනෙ පහලට යන පඩිපෙළක්.

"අපි කොහෙද මේ යන්නෙ"

"ඔබ හිතුවද රාජ මාලිගාව තියෙන්නෙ සීගිරිය මුදුනෙ කියලා"

"මම නම් ඉගනගෙන තියෙන්නෙ එහෙමයි"කියලා මම කිව්වා."

"ඔවු එහෙම තමයි ඉංග්‍රීසීන් ඔයාලට උගන්වන්වල තියෙන්නෙ"

"ඒ කිව්වෙ මට තේරුනේ නෑ"මම එයාගෙන් ඇහුවා.

"ඉංග්‍රීසීන් කැමති උනේ නෑ එයාලට වඩා විශිෂ්ඨ නිර්මාණ කරපු ජාතියක් තව තිබුනා කියන එක පිලිගන්න.ඒක නිසා ඔවුන් අපේ ඉතිහාසයේ සමහර ස්ථාන වෙනස් කරා.ඒවගේ වෙනස් කරපු දෙයක් තමයි මේ සීගිරිය කියන්නෙත්. ඒ කාලයේ ඔවුන් සතුව තිබුනු තාක්ෂණය එක්ක ඔවුන්ට පුලුවන් තරම් අපේ ශ්‍රී ලංකාවේ තිබුනු විශිෂ්ට දේවල් විනාශ කරා.ඒ වගේම කාටවත් හොයාගන්න බැරි වෙන්න සගවලා දැම්මා.සමහර දේවල් ඔවුන් තමන්ගෙ රටට අරන් ගියා.අපි අවුරුදු 500 කට පමණ පෙර සොයාගත් දේවල් ඔවුන් තව වසර ගනනාවකට පස්සෙ නව නිපැයුම් ලෙස එලි දැක්වුවා"

"ඒත් ඔබ කොහොමද මෙච්චර හොදට මේ දේවල් ගැන දන්නෙ ඒ කිසිම දෙයක් තාම සිදුවෙලා නෑනෙ."

ඔහු පිලිතුරක් නොදීම පඩිපෙළ අවසානයේ තිබුන දෙරක් විවෘත කරා.

"ඔබට තියෙන ප්‍රශ්න සියල්ලට පිලිතුරු ලැබෙයි.මෙතනින් පිලිගනවා කාලයාත්‍රිකයින්ගේ මධ්‍යස්ථානයට"

කාලයාත්‍රිකයා:04

Charuka Deshan

මම ඒ කාමරය දිහා බැලුවා.ඒ කාමරය හරිම විශාලයි. බිත්තියේ අයිනේ දිගටම පුටු තියලා තිබුනා.මම ඒ පුටුවක ගිහින් වාඩි උනා.

"හොදයි එහෙනම් මගේ රාජකාරිය මෙතනින් අවසන් වෙනවා.ඔබව හමු වෙන්න ඔබගේ ගුරුතුමා පැමිනේවි."

එහෙම කියපු ගමන් ඔහු කාමරයෙන් පිටව ගියා.මම විනාඩි දහයක් විතර වෙච්ච දේවල් ගැන කල්පනා කර කර හිටිය.ඒත් එක්කම එක පාරටම අමුතු සද්දයක් ඇහුණා.ඒ සද්දේ මට කොහෙදි හරි අහලා පුරුදුයි කියල දැනුන.එතකොට තමයි මට මතක් උනේ.මම කාලය හරහා ගමන් කරන්නට කලියෙන් මට මේ සද්දෙ ඇහුනා කියල .ඒ කියන්නේ තවත් කවුරු හරි කාලයාත්‍රිකයෙක් මෙතෙන්ට එනවා වෙන්න ඇති කියල මට හිතුනා .එක පාරටම විශාල එළියක් එක්ක කාමරය මැදින් වයසක මනුස්සයෙක් මතු උනා.

"ආයුබෝවන් ආධුනික කාලයාත්‍රිකයා.එහෙම නැත්නම් මම ඔබට සහන් අබේසිංහ කියලා කතා කරන්නද?"

"ඔයා කොහොමද මගේ නම දන්නේ"

"මම ඔයාගේ නම විතරක් නෙමෙයි ඔයාගේ අම්මයි තාත්තවයි හොඳට අඳුරනවා.මම ඔයාගෙ ගෙදරත් ඇවිල්ල තියනවා"

"මම ඔයාගෙ තාත්තගෙ හොදම යාලුවෙක්"

"මම ඔයාට මාව අඳුන්වලා දෙන්නම්.මම පැරණිම කාලයාත්‍රිකයෙක්.මම තමයි ඔයාගේ අලුත් ගුරුවරයා"

එතකොට තමයි මට මතක් උනේ එද තාත්තගෙ එද තාත්තාගෙ තාත්තාගේ ලැබ් එකට ගියපු වෙලාවේ දැක්කේ මේ මනුස්සය කියල.මම බය උනා මොකද මම ඒ පෑන හොරකම් කරපු නිසා.

"මම හිතන්නේ දැන් ඔබට මතක් උනා.. මම තමයි ඔයාගේ තාත්තගේ lab එකේදී දැක්කේ."

මම බය උනා.මොකද මම තාත්තගෙ lab එකෙන් හොරෙන් තමයි පෑන ගත්තෙ.ඒක නිසා මම ඔහුට කිව්වා.

"පෑන හොරෙන් ගත්තට මට සමාවෙන්න"

"ඔයා හිතාගෙන හිටියෙ ඔයා පෑන හොරකම් කරා කියලද"

"නෑ ළමයා මේක ඔයාට දුන්නෙ මම"

Charuka Deshan

"ඒ කොහොමද"  මම එයාගෙන් ඇහුවා.

"ඔයාට මතකද තාත්තගෙ lab එක වටේම සාමාන්‍යයෙන් ඉන්න ආරක්ෂකයින් ගාන"

"මම තමයි ඒ ආරක්ෂකයින් එතනින් ඉවත් කරේ.ඒ වගේම ඔයාට මග පෙන්වපු ඒ ආරක්ෂකයා එතනට එව්වෙත්,අර ඉතිහාසෙ paper එකත් මගේ සැලසුමේ කොටස්"

"ඒ සැලසුම පලවෙනි සැරේම වැඩ කලා .එහෙම වැඩ කරේ නැති උනත් මගේ කාලය අපතේ යන්නෙ නෑ මොකද මට ඒ වැරදුන තැන හදා ගන්න පුලුවන් "

"හොඳයි එහෙනම් අපිට යන්න වෙනවා අනාගතයට තවත් නවක කාලයාත්‍රිකයෙක් හමු වෙන්න. ඔහු ඔබත් එක්ක ඉගනගන්නවා කාලය හා කාලතරනය ගැන."

ඔහු තමන්ගෙ සාක්කුවට අත දල පෑන අතට ගත්තා.මම හිතුවා එයා මොකක් හරි දෙයක ලියන්න හදනවා කියලා ඒත් ඔහු පෑන අතට අරගෙන.කේටි අපිව 2052 වර්ෂයේ කොළඹ නගරයට අරගෙන යන්න කියලා කිව්වා.ඒත් එක්කම එක පාරටම මට අමුතු ස්ද්දෙ ඇහුනා ඒ එක්කම මගේ ඇස් දෙක පියවුනා.ඇස් අරිනවත් එක්කම මම හිටියෙ කාමරයක් ඇතුලෙ.අර වයසක මනුස්සයා හිටියෙ නෑ.මම කාමරයෙන් එලියට ආවා.මම හිටියෙ ලොකු නගරයක.ඒ නගරය හරිම ජනාකීර්ණයි හැම තැනම පාරවල් තිබුනා.ඒ පාරවල් පුරාම වාහන එතන එකම සෝෂාවක් තිබුනෙ.ඒ වගේම මට හුස්ම ගන්න අමාරුත් උනා ඒ තරම් වායු දූෂණය වැඩි වෙලා."2050 වර්ෂය වෙනකොට රටේ සියලු ඛනිජ තෙල් භාවිතය නවතා දමනවා."මට මතක් උනා දේශපාලනඥයින් කියපු කතා.ඒ වගේම මට දුකක් දැනුනා රටට වෙච්ච දේ  ගැන.

ඒ එක්කම මගේ පිටට කවුද තට්ටු කරා.මම  පිටිපස්ස බැලුවා.ඒ අර වයසක කාලයාත්‍රිකයා එයත් එක්ක තව කෙනෙක් හිටියා.

"ඔයාට හරිම පුදුම ඇති නේද මේ දේවල් දැකලා.අනාගතය කිව්වාම හිතෙන්නෙ හරිම දියුණු තාක්ෂණයක් තියෙන කාලයක් කියලා.මේ ශ්‍රී ලංකාව ඇරෙන්න අනිත් රටවල් ගොඩක් නව තාක්ෂණය භාවිතය ගිහින් තියෙන්නෙ.ගොඩක් රටවල් ඛනිජ තෙල් භාවිතය නවත්තලා විකල්ප බලශක්ති ක්‍රම වලට ගිහින් තියෙන්නෙ"

"හරි මට තේරුනා අනිත් රටවල් විකල්ප බලශක්ති ක්‍රම වලට ගියාම.ඛනිජ තෙල් ඉල්ලුම පහල ගියා එතකොට තෙල් වල මිලත් පහල ගියා ඒක නිසා ශ්‍රී ලංකාව ඛනිජ තෙල්ම භාවිතය ගත්තා "

"නෑ ඔබ වැරදියි  මුලින්ම විකල්ප බලශක්ති වලට ගියේ ඛනිජ තෙල් ආකාර තියෙන රටවල්.ඒ රටවල් වලට තවදුරටත් අවශ්‍ය නැති මේ ඛනිජ තෙල්.කෙන්‍යාව,උගන්ඩාව,ශ්‍රී ලංකාව වගේ රටවල් වලට අත්‍යවශ්‍ය උනා.ඒක නිසා ඔවුන්ට ඕන විදියට මිල ඉහළ යවන්න හැකි වුනා.කොච්චර මිල ඉහළ ගියත් මේ රටවල් වලට තෙල් ගන්න ඕන.ඔවුන්ට වෙන විකල්පයක් නෑ. කවදවත් මේ රටවල් වලට විකල්ප බලශක්ති වලට යන්න බෑ මොකද මේ රටවල් දැනටමත් ඛනිජ තෙල් ගන්න ගොඩක් ණය අරගෙන තියෙන්නෙ.

Charuka Deshan

"මොකද මේ අපේ රට වෙලා තියෙන්න"

මට හරිම කනගාටුවක් දැනුනා.ඒ වගේම මම හිතාගත්තා කොහොම හරි මේ විනාශයෙන් රට බේරගන්න මම කටයුතු කරනවා කියලා හිතා ගත්ත.

"හා...මට අදුන්වා දෙන්න බැරි උනා මේ ඉන්නෙ.අනිත් ආදුනික කාලයාත්‍රිකයා සදුනි."

"එතකොට තමයි මම එයා දිහා බැලුවෙ.."

කාලයාත්‍රිකයා:05

"මෙයත් ඔයා එක්ක පුහුණුවට යනවා"

"අපි දැන්ම පුහුණුව පටන් ගමු"

එහෙම කියලා ඔහු පෑන අතට ගත්තා ඊට පස්සෙ ආපහු ඔහු පෑනට මොකක්ද කිව්වා.එත් එක්කම මට අවට තියෙන සියලු දේවල් නොපෙනී ගියා.මට පෙනුනෙ සදුනියි,අර වයසක කාලයාත්‍රිකයයි විතරයි.එකපාරටම ආපහු අපි අර කාමරයේ ඇතුලෙ හිටිය.

"බොහොම හොදයි ඔයාගෙ ඇග ඉක්මනටම කාලයාත්‍රනයට හුරු වුනා."

"වෙන කාලයාත්‍රිකයින්ට නම් මේකට ගොඩක් කල් ගතවෙනවා"

"ඔයා තුන් පාරයි කාලය හරහා ගමන් කරේ ඒත් ඔයාගෙ ඇග ඒකට පුරුදු උනා.මට ඒකට හේතුව හිතාගන්න පුලුවන්"

"මොකක්ද හේතුව"මම ඇහුවා

"හේතුව මම ඔයාට පසුව කියන්නම්"

එතකොට තමයි මම සදුනිව දැක්කෙ එයාට සිහි නැතිවෙලා.මම එයා දිහා බලපු එක ඔහු දැක්කා.

"සදුනිට තාම පුරුදු නෑ.කාලයාත්‍රරනය ඒකයි එයාට සිහි නැතිවෙලා තියෙන්නෙ එයාට තව ටිකකින් සිහිය එයි"

"ඔයාට මොනව හරි දැනගන්න තියෙනවද මගෙන් කාලතරනය ගැන"

මම කල්පනා කරා ටිකක්.මොකක්ද මට දැනගන්න ඕන කියලා එතකොට තමයි මට මතක් උනේ.එයා පෑනට කතා කරා කියලා.මම ඒග ගැන එයාගෙන් ඇහුවා"

Charuka Deshan

"හැම පෑනකටම වෙනම assistant කෙනෙක් ඉන්නවා.එයා තමයි නිවැරදි ස්ථානයට අපිව ගෙනියන්නෙ එයා තමයි.හරියට  ඔයාලගෙ කාලෙ තියෙන phone වගේ තමයි.එවුනාට මේ තාක්ෂණය ඊට වඩා ගොඩක් දියුණුයි.

"ඒ කියන්නෙ මේ පෑනෙත් ඒ වගේමද"

ඔවු හැබැයි පුහුණුව සම්පූර්ණ කරනකම් ඔයාට ඒව පාවිච්චි කරන්න බෑ "

"එවුනාට ඔයාට සමාන්‍ය විදියට පෑනෙන් ලියලා ඔයාට ඕන තැනට යන්න පුලුවන්"

එහෙම කියනවත් එක්කම සදුනිට සිහිය ආව.ඊට පස්සෙ අපි පඩිපෙලින් ඉහළට ගියා.අපි තුන් දෙනාම සීගිරිය මුදුනට ආවා.

"සදුනි අපි ඉන්න ක්‍රි.ව පස්වන සියවසේ අග භාගයේ සීගිරියේ.මෙතන නිර්මාණය කරලා තියෙන්නෙ රාවණා රජ සමයෙ.ඔයාල හිතාගෙන ඉන්න විදියට පලමු කාශ්‍යප රජතුමා නෙවෙයි මෙතන නිර්මාණය කරලා තියෙන්නෙ රාවණා රජ්ජුගෙන් පස්සෙ මෙතන නැවත භාවිතයට අරගෙන තියෙන්නෙ මෙතුමා."

"ඒත් මම හිතාගෙන හිටියෙ මෙතන නිර්මාණය කරේ කාශ්‍යප රජ්ජු කියලනෙ"සදුනි එහෙම ඇහුවා.

"මමත් හිතාගෙන හිටියෙ එහෙමමයි"මමත් එහෙම කිව්ව

"හොදයි එහෙනම් අපි රාවණා යුගයට යමු.එතනදිම වැඩි විස්තර කතා කරමු"

"ඔහු එහෙම කියලා පෑන අතට අරගෙන යන්න ඕන කාලය හා ස්ථානය කිව්වා.එතකොට අපි හිටියෙ රාවණා රජ සමයෙ.මම ඒක දැනගත්තෙ අපි හිටියෙ ගුවන් යානා නවත්වන තැනක කියලා දැක්ක නිසා.මම අහල තිබුනා රාවණා රජ්ජුට දඩුමොනරය කියන නමින් හදුවන ගුවන් යානයක් තිබුනා කියලා.ඒත් මෙතන එක ගුවන් යානක් නෙමෙයි යානා ගොඩක් තියෙනවා.හැබැයි ඒ හැම ගුවන් යානයකටම වෙනම වේදිකාවක් තිබුනා අපි හිටියෙ ඒ වගේ එක වේදිකාවක.

"පිලිගනවා ඔබව කාලයාත්‍රිකයිනි ඔබ මෙහි පැමිණියේ කුමක් නිසාද"

"අපි මෙහි පැමිණියේ කාලයාත්‍රික පුහුණුව සම්පූර්ණ කිරීමට මේ ආදුනික කාලයාත්‍රිකයින් දෙදෙනෙක්"

"අපිට රජ්ජුව හමු වීමට අවශ්‍යයි."

"සමාවෙන්න ඔබට මොහොතක් රැදී සිටින්න වෙනවා රජ්ජු මධ්‍යම කදුකරයට ගොසින් සූර්ය නමස්කාරයට"

Charuka Deshan

*එහෙම කියලා ඔහු පිටව ගියා.*

*"එයා කිව්වෙ මධ්‍යම කඳුකරයට කියල"*

*"ඔවු ඔහු හැමදම උදෑසන එහේ යනවා.දැන් ඔහු පැමිනේවි"*

*"එහෙම වෙන්න කොහොමද මධ්‍යම කඳුකරයට සීගිරියෙ ඉදලා  කිලෝමීටර් දෙසීයක් විතර ඇති කොහොමද එයා එච්චර දුරක් යන්නෙ හැමදම උදේ."සදුනි අපේ කතාවට හවුල් වෙමින් එහෙම කිව්වා."*

*"උත්තරේ මේ ඔයාලගෙ ඉස්සරහ තියෙන්නෙමේ ගුවන් යානයෙන් එතනට යන්න විනාඩි දහයක් විතර තමයි යන්නෙ"*

*"හානේ... මට ඒක අමතක උනා අපේ කාලෙ නම් සීගිරියෙ ඉදල නුවරට යන්න දවසට වැඩි කාලයක් යනවා"සදුනි කිව්වා.*

*මම සදුනි දිහා බලලා හිනා වෙලා මෙහෙම හිතුවා."මම හිතාගෙන හිටියෙ කාලයත් එක්ක තාක්ෂණික දියුණුවක් අපේ රටට ලැබෙනවා කියලා ඒත් වෙලා තියෙන්නෙ ඒකෙ අනිත් පැත්ත දියුණුවක් වෙනුවට රට තවත් නොදියුණු තත්වයකට පත් වෙලා.ඒකට වැරදි රටේ දේශපාලනඥයින්ද?නැත්නම් මහජනතාවද?එහෙම නැත්නම් වෙන කවුරුහරිද?"*

*කාලයාත්‍රිකයා:06*

*"ඔයාල දන්නවද මොකද මම ඔයාව මෙතනට එක්කගෙන ආවෙ කියලා"*

*"නෑ"කියලා මම කිව්වා."ඇත්තටම අපිව මොකටද මෙතනට එක්කගෙන ආවෙ"සදුනි ඇහුවා.*

*"මෙතන තමයි කාලයාත්‍රනය ආරම්භ කරපු තැන රාවණා රජතුමා තමයි පලමු කාලයාත්‍රිකයා කිව්වොත් මම නිවැරදියි."*

*මම මගේ ඊලඟ ප්‍රශ්නය අහන්න හදනකොටම"හරි මට තේරෙනවා ඔයාලගෙ ඊලඟ ප්‍රශ්නය.මේ ප්‍රශ්නය ඔයාලගෙ ඉගනීමටත් සම්බන්ධයි."*

*"ඔයා අහන්න ගියේ කාලයත්‍රනය කියන විෂය මෙච්චර අතීතයට යනවා නම් අපි මේක ගැන දැනගන්න ඕන"කියලනේ*

*"ඒ ප්‍රශ්නයට පිලිතුර තමයි කාලයාත්‍රනය කියන්නෙ හරිම භයානක දෙයක්.ඒක නිසා කාලයාත්‍රිකයින්ට නීති පනවලා තියෙනවා.පලවෙනි නිතිය තමයි කාලයාත්‍රිකයෙකුට තමන් ජීවත් වෙලා ඉන්න කාලයට යන්න තහනම්.තව නීති ගොඩක් තියෙනවා ඔයාලට ඉගනගන්න.ඊලඟ නීති වලින් ඔයාලට තේරේවි කාලයාත්‍රනය මෙච්චර රහසිගත වුනේ කොහොමද කියලා"*

Charuka Deshan

*"ඒ කියන්නෙ අපිට ආපුහු ගෙදර යන්න වෙන්නෙ නැද්ද "සදුනි ඇහුවා.*

*එතකොට තමයි මටත් හිතුනෙ ජීවත්වන කාලයට යන්න බැරි නම් කොහොමද ගෙදර යන්නෙ කියලා.*

*"කලබල වෙන්න එපා ඒකට වෙන ක්‍රමයක් තියෙනවා"*

*"ඒ මොකක්ද"මම ඇහුවා*

*"ඒකත් කාලතරනයක් තමයි.ඒත් ඒකෙදි  කාලය හරහා ගමන් කරන්නෙ ඔයාගෙ මතකය විතරයි"*

*"ඒ කොහොමද"*

*"මම හිතන්නෙ ඔයාට පැහැදිලි මදි වගේ "*

*"අපි මෙහෙම කියමු දැන් සාමාන්‍ය කාලතරනයේදී වෙන්නෙ අපේ ශරීරය සහ මතකය කියන දෙකම කාලය හරහා ගමන් කරන එක"*

*"ඒත් එහෙම කාලයාත්‍රරනය කරන එක හැම තැනදී කරන්න බෑ.තමන් ජීවත් වෙලා ඉන්න කාලයට  එහෙම ගියොත් කාලය උත්සහ කරනවා දෙන්නම එකතු කරන්න.ඒ කාලය නිවැරදිව පවත්වගෙන යන්න සිදු කරන දෙයක්.ඒකෙ ප්‍රතිපලයක් ලෙස දෙන්නම එක්කෙනෙක් බවට පත් වෙනවා ඒත් එකෙ අතුරු ප්‍රතිපල තියෙනවා ඒව පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වෙනවා"*

*"ඒක නිසා කාලයාත්‍රිකයින්ට ආපහු ජීවත්ව ඉන්න කාලයට යන්න ඕන නම් ඒකට වෙනම යන්ත්‍රයක් තියෙනවා.ඒකෙන් වෙන්න දැනට තියෙන ශරීරය විනාශ කරලා තියෙන සියලු මතකය වෙන් කරලා අරගෙන ඒ මතකය අවශ්‍ය තැනට යොමු කරන එක.එතකොට වෙන්න ජීවත්ව සිටින කාලයේ තිබෙන ශරීරයට ඒ මතකය ආරෝපණය වීමක් විතරයි.මොලය හරිම පුදුමාකාරයි ඒක අපි වැඩේ පහසු කරනවා අවශ්‍ය වන මතකය විතරයි ආරෝපණය කරන්නෙ අනිත් මතකය ඉවත කරනවා.ඒක නිසා කාලයාත්‍රිකයාට තමන් අනාගතයට හෝ අතීතයට ගියපු හැටි මතක තියෙනවා"*

*"ඒක කරන්නෙ කරන්නෙත් මේ පෑනෙන්මද" කියලා සදුනි ඇහුවා.*

*"නෑ ඒකට වෙනම යන්ත්‍රයක් තියෙනවා.ඒක නම් ටිකක් විශාලයි.මොකද ඒ යන්ත්‍රය නිපදවෙලා තවම අවුරුදු දහයක් විතර ගතවෙලා තියෙන්නෙ."*

*"එතකොට මේක"කියලා මම පෑන පෙන්නුවා.*

*"මම කිව්වේ මේ විෂය ගොඩක් පැරණියි කියලා.ඒ කාලය තුල මේ විෂය දියුණුවුනා.ඒක නිසා තමයි මෙච්චර පොඩි පෑනකට කාලයන්ත්‍රයක් දලා නිර්මාණය කරලා තියෙන්නෙ"*

Charuka Deshan

"ඒත් ඇයි පෑනකට වෙන දෙයක් භාවිතා කරන්න තිබුනනෙ" කියලා සදුනි ඇහුවා.

"ඒකටත් හේතුවක් තියෙනවා.පෑන කියන්නේ සාමාන්‍ය දෙයක් අතීතයේදීත් අනාගතයේදීත් පෑන සාමාන්‍ය දෙයක් ඒක නිසා කවුරුවත් ඒ ගැන සැක හිතන්නෙ නෑ.ඒ නිසා තමයි සෑහෙන දුරට මේ කාලයන්ත්‍රය දුල නිර්මාණය කරලා තියෙන්නෙ.ඒ වගේම මේ පෑන වෙන කෙනෙක් අතට ගියොත් ඒක වැඩ කරන්නේ සාමාන්‍ය පෑනක් විදියට අයිතිකරුගේ අතට ගියොත් විතරයි කාලය හරහා ගමන් කරන්න පුළුවන්.ඒ කියන්නේ ඔයාලා තමයි දැන් ඔය පෑන් වල අයිතිකාරයෝ "

ඒත් එක්කම රජ මාලිගාවේ හිටපු සේවකයෙක් අපේ ළඟට ආවා.

" රජතුමා පැමිණියා .දැන් ඔබලා බලාපොරොත්තුවෙන් රජතුමා සිටින්නේ කරුණාකර මා පසුපසින් පැමිණෙන්න"

ඔහු අපිව එක්කගෙන රාජ මාළිගාව තුළට ඇවිද ගෙන ගියා.රාජ මාළිගාව නිර්මාණය කරලා තියෙන්නේ සීගිරිය තුල ඒක නිසා ඒකෙ බිත්ති නිර්මාණය වෙලා තියෙන්නේ කළු ගල්වලින්.මම ඒ කලුගල් බිත්තියක් අල්ලලා බැලුවා. නමුත් ඒවා ඉතා ම සුමුදු ලෙස ඔප මට්ටම් කරලා තිබුණා.හරිම අලංකාර ලෙස වර්ණ ගන්වා තිබුනා.මාලිගාව තුල තැනින් තැන විශාල පොකුණු.සමහර ඉර එලිය වැටුන තැන් වල ගස් වවලා තිබුණා.මේ සුන්දර වටපිටාව බලමින් අපි රාජ්‍ය සභාවට පිවිසුනා.

"බොහොම සතුටුයි ඔබලාව හමු වෙන්න ලැබිච්ච එක ගැන."

ඒ හඬ ආවේ අපේ පිටිපස්සෙන්.එහෙම කිව්වේ රාවණා රජු වෙන්න ඇති කියලයි මට හිතුනා.මම පිටි පස්ස හැරිල බැලුව.එතන හිටියෙ ඉතාම ප්‍රියමනාප පෙනුමක් තියන පුද්ගලයෙක් ඔහු ඉතාම සිනහ මුසු මුහුණින් අපේ ලගට ආවා.

"මේ දෙන්නා වෙන්නැති ආධුනික කාලයාත්‍රිකයෝ ඔයාලවත් ඒ වගේම ගුරුතුමාවත් සාදරයෙන් පිලිගන්නවා"

"මම හිතන්නේ දැන් තමයි ඔයාලා ඔයාලගෙ පුහුණුව ආරම්භ කරන්න ඇත්තේ"

"එහෙමයි රජතුමනි" කියලා මම කිව්වා.

"හොඳයි...හොඳයි.... එහෙනම් අපි යමු පළමු කාලයන්ත්‍රය බලන්න."

ඔහු අපිව එක්ක ගෙන පඩි පෙළක් දිගේ පහළට ගියා.මට මතක් වුණා මෙතනට මම කලින් ඇවිල්ල තියෙනව කියලා.ඔහු පඩිපෙළ අවසානයේ තිබුන කාමරයක දෙර ඇරියා.එතන තිබුනේ ඉතාම විශාල යන්ත්‍රයක්.

"මේ තියෙන්නේ තියෙන්නෙ පළවෙනි කාලයන්ත්‍රය"

"මේක දැන් නම් භාවිතයට ගන්නේ නෑ."

Charuka Deshan

*"මට සමාවෙන්න.මට නම් මෙතන ඉන්න වෙන්නේ නෑ.මට රාජ්‍ය මාලිගාවෙන් බැහැරට යන්න සිද්ධ වෙනවා."*

*"ගුරුතුමා ඔබලාට මේ ගැන කියලා දේවි"*

*"අවශ්‍ය ඕන දෙයක් සේවකයන්ගෙන් ඉල්ලන්න ඉල්ලන්න ඔවුන් ඔබ ලග ලබාදෙයි"*

*"මම දැන් යන්නම්"එහෙම කියලා ඔහු පිටව ගියා.*

*"හොදයි මේ තියෙන්නේ පළමු කාලයන්ත්‍රය මේ යන්ත්‍රයෙන් තමයි කාලය හරහා පළමුවෙන්ම ගමන් කරලා තියෙන්නේ.ඒ වගේම පළමු කාලයාත්‍රිකයා තමයි රාවණා රජු."*

*කාලයාත්‍රිකයා:07*

*"මේ කාමරය තුල තමයි පලමු කාලයාත්‍රරනය සිදු වෙලා තියෙන්නෙ."*

*"ඔයාලට මතකද අපි මීට කලින් මේ කාමරයට  ඇවිල්ලා තියෙනවා"*

*"ඔවු අපි කාශ්‍යප රජතුමාගෙ කාලයට ගියපු වෙලාවෙත් හිටියෙ මේ කාමරයෙමයි."සදුනි කිව්වා.*

*ඒත් ඒ කාමරයේ කාලයන්ත්‍රය තිබුනෙ නෑ කියලා මට මතක් උනා. ඒක නිසා මම ඒගැන ඇහුවා.*

*"ඔවු ඔබ හරි ඒ කාලයන්ත්‍රය එතකොට එතනින් ඉවත් කරලා.ඒක කාලයාත්‍රිකයින්ගේ මධ්‍යස්ථානයට ගෙනිහින් තියෙන්නෙ."*

*"ඒත් මම හිතාගෙන හිටියෙ කාලයාත්‍රිකයින්ගේ මධ්‍යස්ථානය.තමයි ඒ කාමරය කියලා.එතන හිටපු පිලිගැනිමේ නිලධාරියා මට කිව්වෙ එහෙමයි.*

*"සමහර දේවල් ඒ වගේ නිලධාරින්ගෙන් සගවලා තමයි තියෙන්නෙ.මොකද ඔවුන් මහ ජනතාව ගාවට යනවා එයාල කියන දේවල් ජනතාව පිලිගන්නවා මොකද ඔවුන් රජුගේ සේවකයින් නිසා.මේ වගේ දෙයක් ජනතාව දැන ගත්තොත් ඒක පරම්පරාවෙන් පරම්පරාවට යනවා.එහෙම උනොත් අනාගතයට මේ කාලයත්‍රනය පිලිබඳ දැනගන්න ලැබෙනවා.ඒක නිසා අපි වුවමනාවෙන්ම කරුනු ගොඩක් සගවලා තියෙන්නෙ.එතකොට නිවැරදි ලෙස කරුනු ගැලපෙන්නෙ නැති නිසා ඒව මිත්‍යා විශ්වාස බවට ඉබේම වැටෙනවා."*

*"ඇයි එහෙනම් මේ හැම දෙයක්ම අතීතය තුලම නිර්මාණය කරලා තියෙන්නෙ.ඇයි ඔයාල ආදුනික කාලයාත්‍රිකයින් අතීතයට ගෙන්වාගෙන පුහුණු කරන්නෙ"*

Charuka Deshan

*"ඒකට හේතු දෙකක් තියෙනවා එකක් තමයි.කාලයත්‍රනය ආරම්භය කරන්න කලින් ආධුනිකයින් දැන ගන්න ඕන මේ විශයේ ආරම්භය හා අපේ රටේ වැලලී ගිය.නෑ...නෑ වලලා දමපු ශ්‍රේෂ්ඨ ඉතිහාස ගැන.අනිත් හේතුව තමයි අනාගතය  කියන්නෙ හරිම අස්තාවර ස්ථානයක කාලයාත්‍රිකයිගේ වැඩ නිසා තමයි එහෙම වෙලා තියෙන්නෙ කාලයාත්‍රිකයෙක් අතීතයේ කරන පොඩි වෙනස්කමකින් කාලය සම්පූර්ණයෙන් වෙනස් වෙන්න පුලුවන්.එතකොට අනාගතයට වෙනස් වෙනවා.අනාගතය වෙනසක් දැනෙන්නේ කාලයත්‍රිකයින්ට විතරයි.සාමාන්‍යය අයට ඒ දේවල් දැනෙන්නෙ නෑ.ඒ මොකද ඔවුන් අනාගතය ගැන දන්නෙ නෑ.එක දවසක් ආධුනික කාලයාත්‍රිකයෙක් අතීතයට ඇවිල්ල ටොෆියක කොලයක් අතිතය තුල දල ගිහින් තිබුනා ඒ කොලය පුරාවිද්‍යා කැනීමකින් අනාගතයේදී හොයාගෙන තිබුනා ඊට පස්සෙ අනාගතය තුල ලොකු කැලබීමක් ඇති වුනා.කාලයාත්‍රිකයින් ටොෆි කොලය දපු ප්‍රදේශය පුරාම ඒ කොලය හෙව්වා.අවසානයේ ඒ කොලය හොයාගෙන ඒ කාලයෙන් ඉවත් කරාට පසුව නිවැරදිව කාලය ගමන් කරා.එහෙම තමයි අතීතයේදී කරන පොඩි වෙනසක් අනාගතය සහමුලින්ම වෙනස් කරන්න පුලුවන්."*

*"දැන් අපි ඊලඟට මොකද කරන්නෙ කියලා සදුනි ඇහුවා"*

*"දැන් අපි යමු කාලයාත්‍රිකයින්ගේ මධ්‍යස්ථානයට කේටි අපිව එතනට එක්කගෙන යන්න"*

*එයා මේ සැරෙ පෑන එලියට ගන්නෙත් නැතුව කිව්වා.අපි එක පාරටම අපිව ඇදිලා යනවා වගේ දැනුනා අපි පෘථිවියෙන් එලියට යනවා වගේ පෙනුනා තප්පරයක් යන්න කලින් අපි යානයක් තුලට ඇතුල් උනා.කිසිම දෙරක් ඒ යානයේ විවෘත උනේ නෑ ඒ යානය හරහා තමයි අපි ඇතුල් උනේ.යානයට ඇතුල් උනු ගමන් කාලයාත්‍රිකයා කිව්ව.*

*"මම ටිකකින් එන්නම් ඔයාල මෙතනට වෙලා ඉන්න කියලා"*

*"මමයි සදුනියි එතන තිබුන පුටුවක වාඩි වෙලා කතා කරකර හිටියා මම එයාගෙන් විස්තර ඇහුවා එයා කිව්වා එයාගෙ අම්මයි තාත්තයි දෙන්නම නෑ කියලා.එයා මන් ගැන විස්තරත් ඇහුවා මම එයාට මමගේ විස්තරත් කිව්වා.*

*එහෙම ටික වෙලාවක් අපි කතාකරකර ඉන්නකොට එතනට තරුණ පිරිමි ලමයෙක් ආව එයා අපි ලගට ඇවිත්.*

*"අපි යමු එහෙනම් කාලයාත්‍රික මධ්‍යස්ථාන තුලට" කියලා කිව්වා*

*"ඔයා කවුද"කියලා සදුනියි මමයි දෙන්නම ඇහුවා.*

*"ආ මට සමාවෙන්න ඔයාලට මාව අදුන ගන්න බැරි උනාද මම අර වයසක කාලයාත්‍රිකයාම තමයි ඒ විදියට ඉන්න අමාරුයි.ඒක නිසා තමයි මේ විදියට වෙනස් උනෙ.*

*"ඒත් ඔයා කොහොමද මෙහෙම තරුණ උනේ"*

*"ඒක අනාගතයේදී බොහොම පහසු දෙයක් ඒක නිසා වයසට යනඑක ප්‍රශ්නයක් නෙවෙයි."*

Charuka Deshan

"අපි යමු නේද එහෙනම්"අපි කාමරයෙන් එලියට ආවා අපි යානයේ තිබුන මාර්ග දිගේ ඉස්සරහට ගියා තැනින් තැන ජනේල තිබුනා ඒ ජනේල වලින් සූර්යා පොඩියට පෙනුනා.ඒ වගේම අපි හිටියෙ රතුපාට ග්‍රහලෝකයක් ලග.මම ඒ ගැන කාලයාත්‍රිකයාගෙන් අහන්න හදනකොටම දැකපු දෙයින් ගොඩක් පුදුම උනා..........

කාලයාත්‍රිකය:08

තාත්තා ඔයා...."තාත්තා ටිකක් අමුතු ඇදුමක් ඇදලා හිටියෙ සුදු කලිසමකුයි අත් දිග සුදු කමීසයකුයි.ඒ ඇදුම සාමාන්‍ය ඇදුමක් නෙවෙයි කියලා බැලූ බැල්මට පේනවා.ඒ ඇදුමෙ අමුතු රටාවක් තිබුනා.ඒ රටාවත් සුදු පාටයි.මට හිතුණා ඒ රටාව තියෙන්නෙ ඇදුම ලස්සන කරන්න නෙවෙයි මේ රටාව තියෙන්නෙ වෙන මොකක් හරි දෙයකට කියලා.

"පුතා ඔයා කොහොමද මෙතනට ආවෙ"

මම තාත්තට පැහැදිලි කරන්න හදනකොටම.

"ඔයාගෙ පුතාවත් තෝරගෙන තියෙනවා කාලයාත්‍රිකයෙක් වෙන්න සුදුසුයි කියලා.බොහොම කලාතුරකින් තමයි මේ වගේ දෙයක් සිද්ද වෙන්නෙ. දෙමාපියන් දෙදෙනාම කාලයාත්‍රිකයින් වෙලා දරුවත් කාලයාත්‍රිකයෙක් වෙන එක.ඔයා දන්නව ඇති නේද කාලයාත්‍රික ඉතිහාසය තුල ඒ වගේ දෙමාපියන් කාලයාත්‍රිකයින් වෙච්ච එක්කෙනයි ඉදල තියෙන්නෙ."

"පුතා මට ඔයාට දෙයක් කියන්න තියෙනවා ඔයාගෙ අම්ම ගැන මම ඔයාගෙන් හැන්ගුවා.ඇත්තටම ඔයාගෙ අම්ම කාලයාත්‍රිකයෙක්.එයා මේ වසර ගනනාව පුරාවටම ලෝකය බේරගන්න මෙහෙයුමකට සහභාගි වෙලා ඉන්නේ.එයා ලොකු කැපකිරීමක් කරලා තමයි ඒ මෙහෙයුමට ගියේ.එයාට පවුලෙන් ඈත් වෙන්න උනා."

"සියලුම කාලයාත්‍රිකයින් වහාම පාලක මැදිරියට පැමිනෙන්න"ඒ සද්දෙ ඇහුනෙ කොහෙන්ද කියලා මට හොයගන්න බැරි උනා වටේම කිසිම ශබ්ද විකාශයනය කරන දෙයක් මට පේන්න තිබුනෙ නෑ.

"පුතා එහෙනම් මම යන්නම් ඔයාව මම පස්සෙ හම්බවෙන්නම්"

"එහෙනම් අපි යමු නේද කියලා කියන ගමන් අපි ගමන ආරම්භ කරා"

මෙච්චර වෙලාවක් කිසිම කතාවක් නැතුව හිටිය සදුනි ප්‍රශ්නය අහන්න පටන් ගත්තා.

"මොකක්ද තියෙන විශේෂත්වය දෙමාපියන් කාලයාත්‍රිකයෝ වුනු ලමයෙක් කාලයාත්‍රිකයෙක් වෙන එකෙ."

Charuka Deshan

"ඒක බොහොම කලාතුරකින් වෙන දෙයක් දැනට අවස්ථා දෙක්කදි විතරයි එහෙම වෙලා තියෙන්නෙ.පලවෙනි අවස්ථාව වෙලා ගොඩක් කල් වෙනවා.එයා අපේ කාලයාත්‍රික නීති වලට විරුද්ධ වෙලා එයාට ඕන විදියට නීති සකස් කරගෙන ඒ නීති  අනුගමනය හමුදවක් හදගත්තා.ඒ හමුදව හරිම භයානකයි මොකද ඔවුන් සියලු දෙනාට කාලයාත්‍රනය කරන්න පුලුවන්.අතීතයේ බිහිවෙච්ච සමහර දියුණු ශිෂ්ඨාචාරය සහමුලින්ම විනාශ කර දමන්න ඔවුන් කටයුතු  කරලා තියෙනවා.මායන්වරුන් විනාශ කිරීමත් ඔවුන්ගෙම වැඩක් තමයි.ඔයාගෙ අම්ම ඒ සංවිධානය විනාශ කර දමන්න තමයි මෙච්චර කාලයක් උත්සාහ කරමින් ඉන්නෙ.

"ඒක එච්චර අමාරුවෙන් කරන්න ඕන දෙයක් නෙවෙයිනෙ අතීතයට ගිහින් ඔහුව හිර කරලා දැම්ම නම් ඉවරයිනෙ."සදුනි එහෙම කිව්වා.එතකොට මටත් හිතුණා ඒක ඇත්ත නේද කියලා"

"ඔවු ඒක තමයි අපේ මුල්ම උත්සහය නමුත් ඒක අසාර්ථක උනා.අපි මීට කලිනුත් මේ වගේ අවස්ථා වලට මුහුන දීල තියෙනවා ඒත් මේ අවස්ථාවේදී නම් ඒ ක්‍රමය සාර්ථක උනේ නෑ මොකද ඔහුගෙ අතීතය වෙනස් කරන්න පුලුවන් ඔහුටම විතරයි.ඒක තමයි දෙමාපියන් කාලයාත්‍රිකයො වුනු කෙනෙක්ගෙ විශේෂත්වය.

"ඒ කියන්නෙ මගේ අතීතය වෙනස් කරන්නත් පුලුවන් මට විතරයද?"මම ඇහුවා

"ඔවු ඔයාට විතරයි"

"ඒත් මේක මට නොකියා ඉන්න තිබුනානෙ ඒ ගැන දැන ගත්තට පස්සෙ මමත් ඒ වගේ වෙයි කියලා බයක් නැද්ද ?"

"මම ඔයා ගැන හොදට දන්නවා.ඔයා කවදවත් ඒ වගේ වෙන්නෙ නෑ කියලා මට විශ්වාසයයි"

"ඔන්න දැන් තමයි නිල වශයෙන් ආරම්භ වෙන්නෙ" එහෙම කියලා ඔහු කාමරයක් ඇතුලට අපිවත් එක්කගෙන ගියා.

"මේ තියෙන්නෙ කාලයාත්‍රිකයින්ගේ දත්ත ගබඩා කරලා තියෙන කාමරය."

ඒ කාමරයේ එච්චර විශේෂ දෙයක් තිබුනෙ නෑ.විශාල තිරයක් එක බිත්තියක සවි කරලා තිබුනා,තව එක පැත්තකින් ජනේලයක් තිබුනා ඒ ජනේලයෙන් රතුපාට ග්‍රහලෝකය හොදට පෙනුනා.

"කේටි......ආධුනික කාලයාත්‍රිකයින් දෙදෙනෙක් ඉන්නවා.කරුණාකරල එයාලව ලියාපදිංචි කරනවද?.

"කරුණාකර හදුනා ගැනීමේ කුටිය වෙත පිවිසෙන්න"එහෙම කියනකොටම කාමරයේ කොනකින් අමුතු එලියක් විහිදුනා.

Charuka Deshan

*"මේ තමයි අපේ කාලයාත්‍රිකයින්ගේ යානයේ තියෙන පරිගණකය.මේ පරිගණකයේ නම කේටි.මේ පරිගණකය තුල තමයි කාලයාත්‍රිකයන්ගේ සියලු දත්ත ගබඩා වෙලා තියෙන්නෙ.ඒ වගේම කාලයත්‍රනයට පහසු කරන්න මේ පරිගණකය සියලුම පෑන් එක්ක සම්බන්ධ වෙලා තියෙනවා.ඒක නිසා ඕනම කාලයාත්‍රිකයෙක් දැන් ඉන්න කාලය සහ ස්ථානය නිවැරදිව හොයා ගන්න පුලුවන්.ඒ වගේම මේ පරිගණයේ ආවරණ කලාපය කාලය ආරම්භයේ සිට වසර 10000 පමණ අනාගතයට යනකම් විහිදෙනවා.ඊට වඩා අනාගතයට ගියොත් මේ පරිගණකයට කාලයාත්‍රිකයින් හොයාගන්න බැරි වෙනවා ."*

*"ඔයා කියන විදියට මේ පරිගණකයට ඕනම කාලයාත්‍රිකයෙක් හොයාගන්න පුලුවන් නම් මගේ අම්මවත් ඉන්න තැන හොයාගන්න පුලුවන් නේද?"*

*"මට සමාවෙන්න ඒක නම් කරන්න විදියක් නෑ ඔයාගෙ අම්ම ඉන්න තැන දැනගන්න අපිට අවසර නෑ.ඔයාගෙ අම්ම  ඉන්නෙ මෙහෙයුමකට සහභාගි වෙලානෙ.මෙහෙයුමකට සහභාගි වෙලා ඉන්න කාලයාත්‍රිකයෙක් පිලිබඳ විස්තර කාටවත් ලබාදෙන්නෙ නෑ."*

*"සමාවෙන්න...ඔබ ආදුනික කාලයාත්‍රිකයින් හදුනාගන්න අවශ්‍යය බව ඉල්ලා සිටියා.ඒක නිසා කරුනාකරලා හදුනාගැනීමේ කුටියට පිවිසෙන්න."*

*කේටි ට පුලුවන් මිනිසෙකුගේ මැදිහත් වීමකින් තොරව තීරණ ගන්න පුලුවන්.ඒක නිසා තමයි ඒ විදියට කිව්වෙ.අර තියෙන්නෙ හදුනාගැනීමේ කුටිය දෙන්නගෙන් එක්කෙනෙක් ඉස්සෙල්ලා යන්න"මම එතකොට සදුනි දිහා බැලුවා.*

*"ඔයා මුලින්ම යන්න...මට නම් බයයි වගේ."*

*මම ඒ එලිය එන තැනට ගියා.එකපාරටම සිලින්ඩරාකාර වීදුරුවක් කාමරේ උඩ ඉදල පහලට ආවෙ මාව ඒ වීදුරුවට මැදිවෙන විදියට.ඒ විදුරුව නිසා මට ඒ එලිය එන තැනින් එලියට යන්න බෑ.එකපාරටම අමුතු එලියක් ආව ඊලඟට මම හිටියෙ ඒ වීදුරුවෙන් එලියෙ.මට හිතාගන්න බැරි උනා මොකක්ද උනෙ කියලා.*

*"හදුනාගැනීම අවසානයි අනිත් කාලයාත්‍රිකයා හදුනාගැනීමේ මැදිරියට පැමිනෙන්න."කේටි එහෙම කිව්වා.*

*එතකොට සදුනි එතනට ගියා.ඒ වීදුරුව ආපහු වැහුනා.මට වෙච්ච විදියටම ලොකු එලියක් ආව එකපාරටම සදුනිත් ඒ වීදුවෙන් එලියට ඇවිල්ල හිටියෙ හැබැයි එයාගෙ ඇගේ තාත්තගෙ වගේ ඇදුමක් තිබුනා.එතකොට තමයි මම බැලුවෙ මගේ ඇග දිහා.මම ඇදගෙන හිටියෙත් ඒ වගෙ ඇදුමක්ම තමයි.*

*"හදුනාගැනීම අවසානයි.ඔබලාට සුබ දවසක්"*

*කාලයාත්‍රිකයා:09*

Charuka Deshan

"මොකද මේ අපිට උනේ.අපි කොහොමද මේ ඇදුම් ඇදගත්තෙ."මම ඇහුවා.

"ඔය ඇදුම තමයි කාලයාත්‍රිකයෙකු අනිවාර්යයෙන්ම කාලතරනය කරනකොට යොදගන්න ඇදුම.මේ ඇදුම මගින් ශරීරයේ ක්‍රියාකාරිත්වය හැම වෙලාවෙදිම අධ්‍යනය කරනවා.ඒ වගේම මේ ඇදුම තුල තව ගොඩක් දේවල් ඇතුල් කරලා තියෙනවා.ඒ දේවල් ඔයාලට පුහුණුව අතර තුර පැහැදිලි කරලා දෙන්නම්."

"එතකොට අපිට මොකද උනේ මේ හදුනාගැනීමේ කුටියෙදි,මට නම් කිසිම දෙයක් දැනුනෙ නෑ"

"බොහොම හොද ප්‍රශ්නයක් සදුනි.ඒ කුටිය තුලදී ඔයාලගෙ ශරීරය විනාශ වුනා."

"මොකක්…කොහොමද එහෙම උනෙ අපි මේ හොදට ඉන්නෙ"මම ඔහුගෙන් ඇහුවා.

"ඒ කුටිය තුලදී වෙන්නෙ ඔයාලගෙ ශරීරය සම්පූර්ණයෙන්ම digital පිටපතක් බවට පත් වීම.ඒ ක්‍රියාවලියේදී ශරීරයේ තියෙන සියලු පරමාණු අංශු උප පරමාණුක අංශු සියල්ලෙම පිලිබඳ විස්තර ගබඩා කර ගන්නවා.ඒ ක්‍රියාවලියේ ප්‍රතිපලයක් ලෙස ඔයාලගෙ ශරීරය සම්පුර්ණයෙන් විනාශ වෙනවා.ඒත් කේට් ට පුලුවන් ඔයාගෙ ශරීරය ප්‍රතිනිර්මාණය කරන්න නැවත තිබුනු විදියටම.ඒ වගේම තමයි ඔයාගෙ ශරීරයට හරියටම ගැලපෙන ලෙස ඇදුම නිර්මාණය කරෙත් කේට්ම තමයි.

"ඒ කියන්නෙ කේට් ට පුලුවන්ද මම වගේ තව කෙනෙක් නිර්මාණය කරන්න"කියලා මම ඔහුගෙන් ඇහුවා.

"ඔවු එයාට පුලුවන් හැබැයි ඒ නිර්මාණය කරන මොහොතෙම ඔයාව විනාශ වෙලා ඔයාගෙ සියලු මතකයන් අත්දැකීම් ඒ නිර්මාණය කරපු ශරීරයට ඇතුල් වෙනවා.එහෙම බැලුවාම ඔයාට බැහැ කොහොමවත් තව කෙනෙක් නිර්මාණය කරන්න.මේ තාක්ෂණය වෙන දේවල් වලටත් භාවිතා කරනවා."

"ඒ මොනවටද"කියලා සදුනි ඇහුවා

"මේ තාක්ෂණය මගින් අපිට පුලුවන් ඕනම තැනකට ඉක්මනින් ගමන් කරන්න.මේ තාක්ෂණය හොයා ගන්නෙත් ඒ සදහාම තමයි.මේ තාක්ෂණය හදුන්වන්නෙ Teleportation කියලා.ඒ වගේම ශරීරය තුල තියෙන ඕනම රෝගයක් ඉවත් කරන්නත් මේ තාක්ෂණය භාවිතා කරනව."

"ඒ කියන්නෙ මේ තාක්ෂණය ගොඩක් ප්‍රයෝජනවත් නේද?."මම ඇහුවා.

"හොදයි එහෙනම් අපි යමු පුහුණුව ආරම්භ කරන්න"

"මම හිතාගෙන හිටියෙ දැනටමත් පුහුණුව පටන්ගෙන තියෙන්නෙ"

Charuka Deshan

"පුහුනුව පටන්ගෙන තමයි තිබුනෙ ඒත් දැන් තමයි පුහුණුව නිල වශයෙන් ආරම්භ වෙන්නෙ."

"කේටි අපිව පුහුණු කදවුරට ගෙනියන්න"

"හොදයි 003 ,ඉල්ලීම ඉටු කරනවා"

"එකපාරටම අපිට අර එළිය පෙනුනා ඒත් එක්කම අපි හිටියෙ අමුතු තැනක.මට එකපාරටම හුස්ම ගන්න බැරි උනා.ඇදුම ඇතුලන් වීදුරු ආවරණයක් ඇවිත් හිස ආවරණය වුනා.ඒ වීදුරුව හරහා බලන්කොට එක පැත්තකින් විස්තර වගයක් තිබුනා ඒ විස්තර කියවන්න උත්සාහ කරන්කොට මුලු වීදුරුව පුරාම ඒ විස්තරය වැටුනා ඒක නිසා මට කියවන්න පහසු වුනා.දකුණු පැත්තෙත් අයිනෙන් location කියලා. දලා තිබුනා මම ඒක දිහා බලනකොටම location:mars කියලා වැටුනා.

"මොනවා අපි ඉන්නෙ අගහරුගෙද?..."කියලා මම කෑගැහුවා.

එතකොටම"ආව්.........මගේ කන්දෙක" කියලා සදුනි කෑගැහුවා.එතකොට තමයි මම හැරිලා බැලුවෙ.

කාලයාත්‍රිකයා:10

"මෝඩයා වගේ කෑගහන්නෙ නැතුව ඉන්නවා"සදුනිත් හයියෙන්ම කිව්වා.

"මෝඩි......මට කියන්නෙ ඔයත් සද්දේ අඩු කරලා කතාකරනවා"

"හා......හා දැන් ඔය ඇති දෙන්නම නවත්ත ගන්න."කාලයාත්‍රිකයා කිව්වා.

"මෙයා තමයි මුලින්ම පටන් ගත්තෙ"

"නෑ මෙයා තමයි පටන්ගත්තේ..."

"නවත්තගන්න...නවත්තගන්න...ඔයාලගෙ රන්ඩුව, ඔයාල හරියට පොඩි ලමයි වගේනෙ හැසිරෙන්නෙ."අපි එයාගෙ කතාව ගානකට වත් නොගෙන රන්ඩු කර කර හිටියා.එකපාරටම සදුනි මට බනින එක නැවැත්තුවා.නැවැත්තුවා කිව්වට එයා බනිනවා මට පේනවා ඒත් ඇහෙන්නේ නෑ.මම හිතන්නෙ එයාටත් මට වගේම මම බනින එක ඇහෙන්නේ නැති නිසා වෙන්න ඇති එයත් ටික වෙලාවකින් බනින එක නැවැත්තුවා.අපි දෙන්නම කාලයාත්‍රිකයා දිහා බැලුවා එයා අපි දිහා බලලා මොනවද කිව්වා.

"හරිද ඔයාලගෙ රන්ඩුව ඉවරද?,එහෙනම් දැන්වත් අපි ආපු වැඩේ කරමුද?"මම මුකුත් නොකියා හිටියා.සදුනිත් මුකුත් කිව්වෙ නෑ.

Charuka Deshan

"හොඳයි එහෙනම් අපි යමු"එහෙම කියලා ඔහු ඉස්සර වුනා.අපි හිටියෙ තැන වටෙන්ම කඳු තිබුනාන්.අපි කන්දක් දිහාවට ගියා.ඒ කන්ද පාමුල පොඩි ගුහාවක් තිබුනා.ඒ ගුහාවෙ ඇතුලට අපි ගමන් කරා ඒ ගුහාව හරිම විශාලයි.හරිම ආලෝකමත් උඩ තිබුන සිදුරු වලින් ගුහාවෙ හැම තැනටම සූර්යාලෝකය හොඳින් ලැබෙනවා.

"මෙතන තමයි ඔයාලගෙ පුහුණුව ආරම්භ වෙන්නෙ"

"කෝ මෙතන මුකුත් නැනෙ"සඳුනි ඇහුවා.

"ඒකනෙ මම හිතාගෙන හිටියෙ මෙතනත් යානයේ වගේ ගොඩක් දේවල් තියෙන තැනක් කියලා"

"ඒ වගේ මුකුත් ඔයාලගෙ පුහුණුවට ඕන නෑ"

"අවශ්‍ය වන ඔක්කොම ඔයාලගෙ ලගම තියෙනවා"

"කෝ අපේ ලග මුකුත් නැනෙ."

"ඔයාලග ඇදුමෙ ඔයාලට අවශ්‍ය ඕනම දෙයක් තියෙනවා"

"ඒ කියන්නෙ කෑමත් තියෙනවද?"මම ඇහුවා

"දැන් ඔයාට අවශ්‍යම දේ කෑමද?"සඳුනි ඇහුවා

"හරි...හරි.....ආපහු පටන් ගන්නද හදන්නෙ,ඔයාට කෑමනෙ ඕන පොඩ්ඩක් ඉන්නෙ.කේටි කරුණාකරල අපිට කෑම ගෙනත් දෙනවද?"

"හොඳයි 003,ඔබගේ ඉල්ලීම ඉටුකරනවා"

"ඔයාගෙ නම 003 ද?" සඳුනි කාලයාත්‍රිකයගෙන් ඇහුවා.

"නෑ ඒක හරියට නමක් වගේ තමයි.ඒ අංකයෙන් තමයි මාව හඳුනාගන්නෙ ඔයාලටත්.ඒ වගේ අංකයක් තියෙනවා.ඒ අංකයෙන් තමයි ඔයාලව හරියට අඳුරගන්නෙ."

එහෙම කියනවත් එක්කම ගුහාව ඇත්ලෙන් එලියක් විහිදුනා.එතකොට මම ඒ පැත්ත බැලුවා.ගුහාව මැද මේසයක් තිබුනා.

"ඔන්න කෑම ආව,යමු එහෙනම් කෑම කාලම පුහුණුව පටන්ගමු."

අපි එතනට ගියා.මේසෙ උඩ කිසිම කෑමක් තිබුනෙ නෑ.මම කාලයාත්‍රිකයා දිහා හැරිලා බැලුවා.

"ඔයාල වාඩි වෙන්නකො "අපි වාඩිවුනා මේසෙ මැදින් අමුතු පෙට්ටියක් වගේ එකක් උඩට

Charuka Deshan

මතු උනා.ඒ පෙට්ටිය එක පැත්තක් වීදුරුවකින් වැහිලා තිබුනා.අනිත් පැති කළු පාටයි මම හිතන්නෙ ඒ පැති වලින් මොනවහරි ලෝහයකින් තමයි නිර්මාණය කරල තියෙන්නෙ.

"ඔයාල කන්න කැමති මොනවද"මට හිතාගන්න බැරි වුනා මොනවද කන්න ඕන කියලා.

"හොදයි...හොදයි...මම කියන්නම් ඔයාලට හොද කෑම වර්ග ටිකක් කාලම බලන්නකො රසද කියලා."එහෙම කියලා."කේටි මට මගේ ප්‍රියතම කෑම වර්ග ටික දෙන්න."කිව්වා එතකොට කෑම වර්ග එක සැරයකට එක ගානෙ අර පෙට්ටිය ඇතුලෙන් මතු වුනා.ඒ කෑම වර්ග මීට කලින් දැකලා තිබුනෙ නෑ.එවුනාට තිබුනු බඩගින්නෙ හැටියට.මම එතන තිබුනු හැම ජාතියෙන්ම වගේ බෙදගත්තා.කාලයාත්‍රිකයත් මාත් එක්කම කෑම බෙදගත්තා.ඒත් සදුනි කෑම බෙදගන්නෙ නැතුව හිටියා.

"සදුනි ඔයත් කෑම බෙදගන්න"කාලයාත්‍රිකයා කිව්වා.

එහෙම කිව්වාම සදුනි කෑම බෙදගත්තා.මට තිබුන බඩගින්නෙ තරමට මට අමතක උනා මගේ මුන ආවරණය වෙන්න තිබුන වීදුරුව අමතක වුනා.

"දැන් ඔයා කෑම කන්නද යන්නෙ"සදුනි මගෙන් ඇහුවා.

"නැතුව ඉතින් කෑම බෙදගෙන බලාගෙන ඉන්නද කියන්නෙ."

"මෝඩයා...කොහොමද ඔයා කෑම කන්නෙ"

"කෑම කන්නෙ කටින් නෙ.ඇයි අනාගතයේදී කෑම කන්න වෙනම යන්ත්‍රයක් තියෙනවද?"

"ඔයාට අමතක උනාද අපි ඉන්නෙ අගහරුවල කියලා.අපි මුහුණු ආවරණයක් දගෙන ඉන්නෙ කියලා"

එහෙම කියනකොට තමයි මටත් මතක් වුනේ ඒ ගැන.මට හිතුනෙ කාලයාත්‍රිකයට වැරදිමක් වෙලා කියලා.

"හරි ඒ ප්‍රශ්නය මම විසදන්නම්.කේටි කාමරය සක්‍රිය කරන්න."එහෙම කියනකොටම මේසෙ යටින් ආපු වීදුරු වගේ දේකින් අපිව වටවෙලා කාමරයක් වගේ ආවරණය වුනා.

"දැන් ඔයාලට පුලුවන් ඔයාලගෙ මුහණු ආවරණ ඉවත් කරන්න.කේටි ට ඒ දේ කරන්න පුලුවන් ඒත් ඔයාලට පුහුණුවෙන්න ඕන නිසා මම කරන විදියට කරන්න ඔයාලගෙ බෙල්ලට යටින් පොඩි බොත්තමක් ඇති ඒ බොත්තම 03න් පාරක් ඔබන්න.මම එයා කිව්ව විදියට කරා එතකොට වීදුරු ආවරණය ඉවත් උනා අපි ඊට පස්සෙ කෑම කෑවා.ටික වෙලාවකට පස්සෙ අපි පුහුණුව ආරම්භ කරා.

"මම ඔයාලට මේ ඇදුම හැදින්වීමක් කරන්නම් මේ ඇදුම මොකටද පාවිච්චි කරන්නෙ කියලා ඔයාල දන්නවානෙ.මේ ඇදුමේ ගොඩක් දේවල් තියෙනවා.ඒ අතරින් විශේෂම දේ තමයි කාල තරනයේදී අපි ගමන් කරන කාලයට අනුව මේ ඇදුම වෙනස් කරන්න

*පුලුවන,ඒ වගේම මේ ඇදුම ඕනම උශ්නත්වයකට ඔරොත්තු දෙනවා.මේ ඇදුම ඇදගත්තට පස්සෙ අපි සාමාන්‍යයෙන් තියෙන ශක්තිය වගේ දහ ගුනයක ශක්තියක් ලැබෙනවා.ඒ වගේම මේ ඇදුමට කිසිම ආයුදයකින් හානි කරන්න බෑ.මේ කිව්වෙ සාමාන්‍යයෙන් මේ ඇදුමට කරන්න පුලුවන් දේවල් ටික විතරයි.තව ගොඩක් දේවල් මේ ඇදුමට කරන්න පුලුවන් හොදයි අපි එහෙනම් පටන්ගමු නේද කාලයට හරියන විදියට ඇදුම වෙනස් කරන විදියෙන්ම".*

*කාලයත්‍රිකයා:11*

*"කේට් අපිට විසි වෙනි සියවසේ ලන්ඩනයේ විලාසිතාවන් වලට වෙනස් කරන්න"*

*මම ඇස් දෙක පියා ගත්තා,ආපහු ඇස් අරිනකොටම අපේ ඇදුම වෙනස් වෙලා.මමයි කාලයාත්‍රිකයයි දෙන්න්නම ඇදගෙන හිටියෙ කෝට් එකකුයි දිග කලිසමකුයි.කාලයාත්‍රිකයගෙ ඔලුවෙ ටිකක් ලොකු තොප්පියක් තිබුනා.මැජික් කරන තොප්පියක් වගේ.සදුනි ඇදගෙන හිටියෙ ටිකක් අමුතු විදියෙ ගවුමක් ඒ ගවුම යටින් පිම්බිලා තිබුනා මම ඒවගේ ඇදුම් දැකලා තිබුනා චිත්‍රපටි වල විතරයි.මම කවදවත් ඒ ඇදුම ඇදගෙන හිටිය කෙනෙක් ඇත්තටම දැකලා තිබුනෙ නෑ.එයා ඒ ඇදුමට හරිම ලස්සනයි.*

*"හොදයි එහෙනම් අපි අනාගතයට ගැලපෙන ඇදුම් විලාසිතාවක් උත්සාහ කරලා බලමු"*

*"කේට් අපිට විසිපස්වන සියවසේ ඇදුම් විලාසිතාවකට මාරු කරන්න"*

*මම ආපහු ඇස් දෙක පියාගත්තා,ඇස් අරිනකොටම මම හිතුවෙ ඉස්සෙල්ලා වගේ ඇදුම වෙනස්වෙලා තියෙයි කියලා ඒත් එහෙම වෙලා තිබුනෙ නෑ.*

*"මොකද වුනේ වෙනස් උනේ නෑනෙ"සදුනි ඇහුවා.*

*"සමහර වෙලාවට ඔයවගෙ බිදවැටීම් වෙනව.උපරිම වශයෙන් විනාඩි 03 ක් විතර තමයි ඒ පවතින්නේ."*

*"අනේ මොකක් හරි කරන්න.මේ ඇදුම හරිම බරයි. මට මේ ඇදුම ඇදගෙන විනාඩි 03ක් නෙවෙයි එක විනාඩියක්වත් ඉන්න බෑ."සදුනි කිව්වා.*

*"හරි කලබල වෙන්න එපා ඔයාලගෙ හැම ඇදුමක්ම ඔයාලටත් පාලනය කරන්න පුලුවන්.ඔයාලගෙ දකුණු අත මිට් මොලවන්න."*

*අපි එයා කියපු විදියටම කරා එතකොට තිරයක් වගේ දෙයක් මගෙ අතේ නිර්මාණය උන.ඒ තිරයේ ඇදුමේ විස්තර ගොඩක් තිබුනා ඒ ඔක්කොම දේවල් තිබුනෙ සිංහලෙන්මයි.මම ඒකෙ තිබුන දේවල් කියවලා ඇදුම විසිපස්වන සියවසේ විලාසිතාවලට මාරු වුනා.සදුනිත් ඒ විදියටම මාරු වුනා විසි පස්වන සියවසේ ඇදුම් වලට.*

Charuka Deshan

"බොහොම හොදයි ඔයාල ඉක්මනට ඉගනගත්තනෙ.දැන් අපිට තියෙන්නෙ කේටි ආපහු ප්‍රතිචාර දක්වන කම් ඉන්න."

අපි විනාඩි දහයක් විතර බලාගෙන හිටියා ඒත් කිසිම ප්‍රතිචාරයක් කේටිගෙන් ලැබුනෙ නෑ.

"මොකක් හරි ප්‍රශ්නයක් වගේ නැත්තම් මෙච්චර වෙලාවක් යන්නෙ නෑ."කාලයාත්‍රිකයා කිව්වා.

"පරිඝනකයේ දත්ත සියල්ල ගබඩා කිරීමට අවසර ඉල්ලා සිටිනවා"කේටිගෙන් පණිවුඩයක් ආවා .

කාලයාත්‍රිකයා බියමුසු මුහුණින් නෑ…නෑ පුදුමයෙන් වගේ ඒ හඩට සවන් දුන්නා.

"අවසර ලබා දෙනවා කාලයාත්‍රික අංක 003න"කියලා කිව්වා.

"මොකද උනේ"මම කාලයාත්‍රිකයාගෙන් ඇහුවා කිසිම ප්‍රතිචාරයක් නෑ.එයා පෑන දිහා බලාගෙන හිටියා.

"දත්ත ගබඩා කිරීම අවසන්"කියලා කේටි කිව්වා විතරයි.

"මට දැනගන්න පුලුවන්ද යානයට මොකද උනේ කියලා"

"යානාවට ප්‍රහාරයක් එල්ල උනා ඒ ප්‍රහාරයෙන් යානයේ දත්ත ගබඩාවට හානියක් සිදු වෙන්න කලින් මම සියලු දත්ත ඔබගෙ පෑනට පිටපත් කරා.ඔබලාට තව විනාඩි දෙකක කාලයක් ඉතිරි වී තියෙනවා පෘථිවියට ගමන් කරන්න.ඒ කාලයෙන් පසු තමා සිටින ග්‍රහලෝකයට පමනක් සීමා වෙනවා කාලතරනය කිරීමට හැකියාව ලැබෙනවා.කේටි දීර්ඝ විස්තරයක් සිදු කරා.

"හොදයි කේටි අපිව පෘතුවියට ගෙනියන්න"කාලයාත්‍රිකයා කලබලෙන් කිව්වා.

එක පාරටම අපි හිටියෙ ටිකක් ජනාකීර්ණ මාර්ගයක් අයිනෙ තිබුනු පටු පාරක.

"කේටි ඉකමනට අපේ ඇදුම්  මේ කාලයට අනුව වෙනස් කරන්න"

අපේ ඇදුම් වෙනස් උනා මම අර ඉස්සෙල්ලා ඇදගෙන හිටපු කෝට් එකයි කලිසමයි ඇදලා.කාලයාත්‍රිකයත් ඒ විදියටම ඇදුම් වෙනස් වෙලා.මම සදුනි දිහාත් බැලුවා එයත් මගේ ඇදුම වෙනස් වෙච්ච විදියටම කෝට් එකයි කලිසමයි විදියටම වෙනස් වෙලා .ඒක කාලයාත්‍රිකයත් දැක්කා.

"පොඩ්ඩක් ඉන්න මම ඔයට හරි ඇදුම විදියට වෙනස් කරලා දෙන්නම්"කියලා එයා පෑන පැත්තට හැරුනා.

"හප්පෝ එපා…ඒ ඇදුම ඇදගෙන නම් මට ඉන්න බෑ.ඔයාගෙ තොප්පිය දෙන්න"සදුනි

Charuka Deshan

කාලයාත්‍රිකයාගෙ තොප්පිය අරගෙන දගත්තා.

"දැන් කාටවත් මාව අඳුරගන්න බෑ"

"අපි බලමු යානයට මොකද උනේ කියලා.කෙට් කරුණාකරල ඒ ගැන විස්තර කරන්න."

"කාලයාත්‍රිකයින් ඔක්කොම රැස්වීමකට සහභාගි වෙලා හිටියෙ.ඒ අවස්තාවේදී තමයි ප්‍රහාරය එල්ල උනේ."කේට් විස්තර කරා.

" කාලයාත්‍රිකයින් පිලිබඳ විස්තර කරන්න ඔවුන්ට ප්‍රහාරයෙන් හානි වුනාද?"

"කාලයාත්‍රිකයින් සියලු දෙනාගෙන්ම කිසිම ප්‍රතිචාරයක් නෑ ඒක නිසා තමයි ඔබගේ පෑනට දත්ත සියල්ල පිටපත් කරේ."

"ප්‍රහාරය එල්ල උනේ කාගෙන්ද කියලා හඳුනාගන්න පුලුවද?"කාලයාත්‍රිකයා ඇහුවා.

"ප්‍රහාරය එල්ල වුනේ අවුරෝරා සංවිධානයේ යානයකින්."

"අවුරෝරා සංවිධානය කියන්නෙ මොකක්ද"මම කාලයාත්‍රිකයාගෙන් ඇහුවා.

"ඒ සංවිධානය තමයි කාලයාත්‍රිකයන්ගේ විරුද්ධවාදීන්.ඔවුන්ගෙ නායකයා තමයි අවුරෝරා කියන්නෙ එයා තමයි දෙමාපියන් කාලයාත්‍රිකයින් වෙච්ච අනිත් කාලයාත්‍රිකයා."

කාලයාත්‍රිකයා අවසාන කොටස

"ඒ කියන්නෙ ඔයා කියපු ඒ දරුනු කාලයාත්‍රිකයාද අවුරෝරා කියන්නෙ."සඳුනි ඇහුවා

"ඔවු එයා තමයි" කාලයාත්‍රිකයා කිව්වා.

එතකොට තමයි මට මතක් උනේ තාත්තත් ඒ යානයේ හිටියා කියලා.

"දෙයියනේ......මගේ තාත්තා එයාට මොකද දන්නෙ නෑ"

"මම හිතන්නෙ එයාල කාලය හරහා ගමන් කරන්න ඇති"කාලයාත්‍රිකයා කිව්වා.

" එහෙනම් කේට් ට පුලුවන්නෙ එයාලව හොයා ගන්න"සඳුනි ඇහුවා.

"කේට් ට ඒ හැකියාව දැන් නෑ.එයාගෙ ඔක්කොම දත්ත තියෙන්නෙ මගේ පෑන ඇතුලෙ.ඒක නිසා කේට්ගෙ ආවරණ කලාපය අනාගතයට වසර දහයකටත්.අතීතයට වසර දහයකටත් සීමා වෙනවා.
කේට් කියන විදියට ඒ කාලය තුල නම් කිසිම කාලයාත්‍රිකයෙක් නෑ එහෙම ඉන්නවා නම් හෝ ආවොත් කේට් අපිට දැනුම් දේවි."

Charuka Deshan

"ඒ කියන්නෙ අපි කාලයාත්‍රිකයින් හොයන්න වසර දහයෙන් දහයට යන්න ඕනද?."

"නෑ එහෙම අවශ්‍ය නෑ.ඔවුන් පුහුණුව සම්පූර්ණ කරපු.අය ඔවුන්ට ඔවුන් ගැන බලාගන්න පුලුවන්"

"අපි එහෙනම් මොකද කරන්නෙ"මම එයාගෙන් ඇහුවා.

"අපිට තමයි බැරෑරුම්ම රාජකාරිය තියෙන්නෙ"

"ඒ මොකක්ද"මම එයාගෙන් ඇහුවා

"කේට්ව අවුරෝරා සංවිධානයෙන් ඈත් කරලා තියන්න වෙනවා.එයාගෙ ලග තමයි කාලයාත්‍රිකයන්ගේ සියලුම දත්ත තියෙන්නෙ"

"එවුනාට කේට්ගෙ පිටපතක් යානයෙත් තියෙනවා නේද්"

"යානය දැන් විනාශ වෙලා ගිහින් මගේ පෑනට දත්ත පිටපත් වෙලා ඉවර වුන ගමන්ම යානය විනාශ වෙනවා යානයෙ තියෙන දත්ත වෙන කෙනෙකුට ලබාගන්න බැරි වෙන්න."

" හොදයි මොකක්ද දැන් අපි ඕන"සදුනි ඇහුවා.

"අපි කේට් ව ආරක්ෂිත ස්ථානයකට ගෙනියන්නෙ ඕන"

එයා එහෙම කියනවත් එක්කම කලු පාට ඇදුම් ඇදගත්ත මිනිස්සු වගයක් අපි ඉන්න දිහාවට ආවා.මම වගේම කාලයාත්‍රිකයත් හිතුවෙ එයාල මේ කාලයට අයිති අය කියලා.එයාල මේ පාරෙන් කොහෙට හරි යනවා කියලා හිතාගෙන අපි පාරෙන් අයින් වෙලා ඔවුන්ට යන්න ඉඩ ලබාදුන්නා  ඒත් එයාල අපේ ලගට ඇවිත් නතර වුනා.

"මොකද මහත්මයා මගෙන් මොනවා හරි දැනගන්න අවශ්‍යද"කාලයත්‍රිකයා ඔවුන්ගෙන් ඇහුවා.

එකපාරටම ටිකක් හැඩිදැඩි ශරීරයක් තියෙන පුද්ගලයෙක් කාලයාත්‍රිකයට වැරෙන් ප්‍රහාරයක් එල්ල කරා.

"කේට් අපිව අනාගතයට ගෙනියන්න"මම කෑ ගහලා කිව්වා.එතකොටම අපි අනාගතයට ඇවිත් තිබුනා.කාලයාත්‍රිකයාට සිහිය නෑ.අපි හිටියෙ පොඩි කාමරයක ඒ  කාමරය පුරාවටම දූවිලි පිරිලා තිබුනා.මම ඉක්මනට එලියට ගියේ වතුර ටිකක් හොයා ගන්න මම එලියට ගිහින් වටපිට බැලුවා.ටිකක් ඈමුතු වතුර මලක් මගේ ඉස්සරහ තිබුනා.මම ඒ වතුර මලෙන් වතුර ටිකක් අරගෙන් ගිහින් කාලයාත්‍රිකයගේ මූනට ඉස්සා එතකොට එයාට යන්තන් සිහිය ආව.සදුනි එයාගෙ ලගට ගිහිල්ලා ලග තිබුනු කොලයක් අහුලලා ඒකෙන් පවන් ගැහුවා.ටික වෙලාවකින් එයාට හොදටම සිහිය ආව.

"ඔයා බොහොම හොද දෙයක් තමයි කරේ.නැත්නම් කේට්ගෙ ඔක්කොම තොරතුරු

Charuka Deshan

අවුරෝරා කණ්ඩායමට ලැබෙනවා එහෙම උනානම් එහෙම මුලු ලෝකයම අනතුරේ.ඒත් තාම අපි ආරක්ෂිත නෑ.එයාල මෙතනටත් එන්න පුලුවන්.ඒක නිසා අපිට සැලසුමක් ඕන කරනවා"

"මොකක්ද සැලසුම"මම එයාගෙන් ඇහුවා.

"එයාල කොහොම හරි දන්නවා අපේ දේවල් ගැන හොදට ඒකයි එයාලට පුලුවන් උනේ අපේ යානය.හොයා ගන්න ඒ වගේම මාව හොයාගෙනත් ආව.කොහොමහරි තාම එයාල ඔය දෙන්න ගැන දන්නෙ නෑ.ඔයාලට තමයි කේට්ව ආරක්ෂා කරන්න වෙන්නෙ."

"එතකොට ඔයාට මොකද වෙන්නෙ"සදුනි ඇහුවා

"එයාලට ඕන මාව විතරයි ඔයාලව නෙමෙයි.ඒක නිසා මම එයාලට අහු වෙන්නම්.එතකොට එයාලගෙ අවදානය මට යොමු වෙනවා.මම පුලුවන් තරම් කාලයක් එයාලව නොමග යවන්නම්."

"එයාල ඔයාට අනතුරක් කරොත් එහෙම"සදුනි ඇහුවා

"එයාල කවදවත් එහෙම කරන්නෙ නෑ මොකද එයාලට මගෙන් ඉගනගන්න ගොඩක් දේවල් තියෙනවා"

මම කාලයාත්‍රිකයයි සදුයි කතා කරන වෙලාවෙ දෙරෙන් එලිය බලාගෙන හිටියෙ.මම දැක්කා ඒ මනුස්සයො එක පාරටම අපි ඉන්න තැනට මීටර් සීයක් විතර දුරින් මතු වෙනවා.

"ඔන්න එයාල එනවා"කියලා මම හෙමින් කිව්වා.

"එහෙනම් මම යන්නම්"එහෙම කියපු කාලයාත්‍රිකයා එයාගෙ පෑන මට දුන්නා.

"මගේ ගාව පෑනක් නැති උනාම එයාල සැක හිත්න්න්න පුලුවන්.ඒක නිසා ඔයාගෙ පැන මට දෙන්න."මම එයාට මගේ පෑන දුන්නා ඊට පස්සෙ එයා අපිට සමුදීලා යන්න හදලා ආපහු හැරුනා.

"මතක තියා ගන්න ඔයාලගෙ අතේ තමයි මුලු ලෝකයේම පැවැත්ම රැදිලා තියෙන්නෙ.නෑ ...නෑ මට වැරදුනා ඔයාලගෙ සාක්කුවේ."එහෙම කියලා අපි දිහා හිනා වෙලා බලලා එයා එලියට ගියා.

එයා ඒ කලේ විහිලුවක් උනත් මටවත් සදුනිටවත් ඒ විහිලුවට හිනා ගියේ නෑ. එයා උත්සාහ කරන්න ඇත්තෙ අපිව හිනස්සවන්න. ඒත් එයාට ඒ දෙය කරන්න බැරි උනේ එයා අපිත් එක්ක හිටිය කාලයේ අපිට ගුරුවරයෙක් වගේ සමහර විට යාලුවෙක් වගේ අපේ අඩුපාඩු පෙන්වා දෙමින් අපිට සමීප වුනු ආකාර නිසා වෙන්න ඇති කියලා මට හිතුනා.

ඒ විදියට තමයි පුංචි පෑනක් මගේ ජීවිතය වෙනස් කරේ.ඒ පෑන නිසා මට ගොඩක් දේවල්

Charuka Deshan

*දැනගන්න ලැබුනා.ඒ වගේම මට ලොකු වගකීමකුත් පැවරිලා තියෙනවා.ලෝකය ආරක්ෂා කරන්න.*

***The End***
***(Time traveler)***
***Part 12***

***🖋 Charuka Deshan 🖋***

*ඔය_විදියට_තමයි_කාලයාත්‍රිකයාගේ_ගමන_ආරම්භ_වෙන්නෙ.*

*ඒවගේම_මේ_තමයි_කාලයාත්‍රිකයා_කතාවේ_අවසානය.*